රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය

**NON CABINET MINISTRY OF STATE PLANTATION ENTERPRISES REFORMS**

**மாநிலத் தோட்டத் தொழில் நிறுவனங்களின் அமைச்சரவை அல்லாத அமைச்சகம் சீர்திருத்தங்கள்**

# ඇල්කඩුව වැවිලි සමාගම
# எல்கடுவ பிளான்டேசன் லிமிடெட்
# ELKADUWA PLANTAIONS LIMITED

# වාර්ෂික වාර්තාව - 2018
# ஆண்டு அறிக்கை -2018
# ANNUAL REPORT -2018

**“ ජනවතු පියස’’ නො 320,ටී.බී.ජයා මාවත ,කොළඹ10.**

**“ஜனவது பியச”இல,320, T.B. ஜயாமாவத்தைஇ, கொழும்பு 10**

**“JANAWATHU PIYASA” NO 320, T.B.JAYAMAWATHA, COLOMBO 10**

# පටුන

දැක්ම, මෙහෙවර හා සාරධර්ම (1)

ආයතන ආකෘතිය (2-3)

සංධිස්ථාන (4)

මූල්‍යමය ඉස්මතුකිරීම් (5)

මෙහෙයුම් ඉස්මතුකිරීම් (6-8)

සභාපතිතුමාගේ සමාලෝචනය (9)

බාන්ඩික තොරතුරු (10)

අධ්‍යක්ෂ මණ්ඩලය (11)

කළමනාකරණ කණ්ඩායම (12)

ඒකාබද්ධ පාලනය (13)

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය (14)

මූල්‍ය වාර්තාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (15)

විස්තීරණ ආදායම් ප්‍රකාශය (16)

කොටස් වෙනස්කම් ප්‍රකාශය (17)

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය (18)

ගිණුම්කරණ ප්‍රතිපත්ති (19-35)

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් (36-49)

ස්වාධීන විගණන වාර්තාව (50 - 59)

දශ වර්ෂ සාරාංශය (60-61)

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය (62)

නියෝජිත ආකෘති පත්‍රය (63)

ආයතනික තොරතුරු (64-65)

**කොළඹ කර්යාලය :ජනවතුපියස,නො .320, ටී.බී.ජයා මාවත, කොළඹ- 10**
**ප්‍රධාන කර්යාලය : රත්වත්ත උකුවෙල**
**ටෙලි: කොළඹ -011-2698059 / ප්‍ර.කාර්යාලය 066-2242521**
**ෆැක්ස් :011-2698057 / ප්‍ර.කාර්යාලය 066-2242521**
**ඊ මේල් : chairmanepl2020@gmail.com**

## දැක්ම

සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින් වතු කර්මාන්තයේ වඩාත්ම අභියෝගාත්මක තරඟකරුවා වීම

## මෙහෙවර

ජාතික අවශ්‍යතා ආරක්ෂාකාරීව මෙහෙයවන අතරතුර සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම තුලින් සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

## සාරධර්ම

| | |
|---|---|
| හොඳම සේවා යෝජකයා: | ගුණාත්මක නිෂ්පාදනය, ව්‍යවසායකත්වය, අගය නිර්මාණය කිරීම, ලාභාදායීතාවය, පරිසර හිතකාමීත්වය සහ ආයතනික සමාජ වගකීම කෙරෙහි අවධානය යොමු කරමින් අවංක, සුදුසුකම් ලත් සහ කැපවූ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම |
| තත්ත්ව සැපයුම්කරු: | උසස් පාරිභෝගික තෘප්තිය සහ අප කරන සෑම දෙයක්ම අකණ්ඩව වැඩිදියුණු කිරීම |
| නිෂ්පාදකතාව: | ඒකක සම්පත් යෙදවුම් සඳහා ප්‍රශස්ත නිෂ්පාදකතාවයක් ළඟා කර ගැනීම, හෙක්ටෙයාරයකට ඉහළම අස්වැන්නක්, තිරසාර පදනමක් මත ප්‍රශස්ත ඉඩම් පරිහරණය, නාස්තිය අවම කිරීම |
| ව්‍යවසායකත්වය: | සෑම විටම අගය නිර්මාණය කිරීමට නව ප්‍රවේශයන් කල් තියා නව්‍යකරණය කිරීම: ව්‍යාපාරික පරිසරයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අඛණ්ඩව ප්‍රතිචාර දක්වයි. |
| ලාභාදායීතාවය: | ප්‍රාථමික නිෂ්පාදනය සහ අගය එකතු කල නිෂ්පාදන සඳහා ප්‍රශස්ත ශුද්ධ විකුණුම් සාමාන්‍යය සහ හැකි අවම නිෂ්පාදන පිරිවැය ළඟා කර ගැනීම |
| පරිසර හිතකාමී බව: | පරිසරයට අවම වශයෙන් හානි වන හෝ හානි නොවන පරිදි සම්පත් ලබා ගැනීම |
| සමාජ වගකීම: | මිනිසුන් හා පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම, යහපාලනයට ගරු කිරීම |

## ආයතන පැතිකඩ

ඇල්කඩුව වැවිලි සමාගම 1993 ජූලි 23 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස පිහිට වූ සහ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි වූ සීමාසහිත වගකීම් සමාගමකි. 1987 දී අංක 23 දරණ රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණ පනත යටතේ පොදු සමාගම් බවට පත්කරනු ලබන විධිවිධානය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් කළමනාකරණය කරන ලද ඉඩම් පවරා ගැනීමෙන් සමාගම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ රන් කොටස් හිමියා වන තනි කොටස් හිමියන්ගේ සමාගමක් ලෙස සමාගම ක්‍රියාත්මක වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය ''ජනවතු පියස'', අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් කළමනාකරණය වන කැලෑබොක්ක රාජ්‍ය වතුයායේ කොටස් 2 ක් හා පහත සඳහන් වතු 10 ක් පවරා ගෙන ඇල්කඩුව වැවිලි සමාගම පිහිටුවීම පිළිබඳ දැන්වීම 1993 ජූලි අංක 776/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඇල්කඩුව වැවිලි සමාගම සඳහා සත්‍ය භූමිය වෙන් කිරීම (අති විශේෂ ගැසට් නිවේදන අංක 776/13 – 1993 ජූලි 13) පහත පරිදි වේ.

| **වතුයාය/ පිහිටීම** | **දිස්ත්‍රික්කය** | **භෝග** | **මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර) යොමු අංක 1** |
|---|---|---|---|
| 1. බණ්ඩාරපොළ, අලවත්ත | මාතලේ | තේ | 283.00 |
| 2. ඇල්කඩුව, ඇල්කඩුව | මාතලේ | තේ සහ කරාබු | 447.78 |
| 3. හුණුගල, ඇල්කඩුව | මාතලේ | තේ සහ කරාබු | 264.73 |
| 4. පිටකන්ද, මාතලේ | මාතලේ | තේ | 520.60 |
| 5. රත්වත්ත, උකුවෙල | මාතලේ | තේ සහ කරාබු | 570.58 |
| 6. සේලගම, යටවත්ත | මාතලේ | තේ | 255.00 |
| 7. හපුගස්පිටිය, මැටිහත්ත | මාතලේ | රබර්, කොකෝවා සහ ගම්මිරිස් | 269.33 |
| 8. මිල්ලවාන, මැල්සිරිපුර | මාතලේ | පොල්, කොකෝවා, රබර්, ගම්මිරිස් | 603.60 |
| 9. නාලන්ද, මඩවල උල්පොත | මාතලේ | රබර්, පොල් සහ ගම්මිරිස් | 496.27 |
| 10. සෙල්ල ඔල්ල, පිහිඹුව | කුරුණෑගල අනු දිස්ත්‍රික්ක | රබර්, කජු සහ අඹ | 358.00 |
| 11. කබරගල/ පොයන්ගල කොට්ටාසය (කැලෑබොක්ක රාජ්‍ය වතුයාය) | මාතලේ | දැව (යුකැලිප්ටස්) | 217.00 (යොමු අංක 2) |
| **එකතුව** | | | **4,285.89** |

**සටහන 01**

කැලෑබොක්ක වතුයායේ හෙක්ටයර 217කින් සමන්විත කබරගල සහ පොයන්ගල කොටස් 02 1995 වසරේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත නැවත භාරගන්නා ලදී.

ඇල්කඩුව වැවිලි සමාගම 100% ක්ම මෙට්‍රොපොලිටන් පුද්ගලික සමාගම මඟින් 1993 සිට පස් අවුරුදු ගිවිසුමක් මඟින් පවරාගෙන කළමනාකරණය කරන ලදී. මෙම ගිවිසුම කල් ඉකුත් වීමත් සමඟ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් 1999 ජනවාරි 19 වන දින නැවත පවරා ගන්නා ලදී.

පාලක කොටස් වලින් 51% ක් පුද්ගලික අංශය වෙත විකුණා 1994 සිට ප්‍රාදේශීය වැවිලි සමාගම්වල අයිතිය පෞද්ගලීකරණය කිරීම රජය විසින් ආරම්භ කරන ලදී. 1994 සිට 2004 දක්වා කාලය තුල පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා අවස්ථා 6 කදී ඇල්කඩුව වැවිලි සමාගම විකිණීමට ඉදිරිපත් කර ඇත. මෙට්‍රොපොලිටන් ඒජන්සි පුද්ගලික සමාගම හෝ වෙනත් කිසිදු ආයෝජකයෙකු පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන්සභාව වෙත පිළිගත හැකි ආයෝජන සැලැස්මක් ඉදිරිපත් නොකළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇල්කඩුව වැවිලි සමාගම භාණ්ඩාගාරයට අයත් ප්‍රාදේශීය වැවිලි සමාගමක් ලෙස පැවතුනි.

## සංධිස්ථාන

සංස්ථාපිත කිරීම - (1993 ජූලි 23) - කළමනාකරණ නියෝජිත - සී/ස මෙට්‍රොපොලිටන් ඒජන්සීස් පුද්ගලික සමාගම.

1993 අගෝස්තු මාසයේදී මෙහෙයුම් කාර්යාලය කොළඹට මාරු කරන ලදී. විධායක නිලධාරීන් 8 දෙනෙක් සහ කාර්ය මණ්ඩලය 30 දෙනෙක් කොළඹ පිහිටි කළමනාකරණ නියෝජිත ආයතනය වෙත මාරු වීමට එකඟ විය. අනෙක් නිලධාරීන් ඉවු කිරීමට රාජකාරියක් නොමැතිව මාතලේ කාර්යාලයේ රැදවිණි.

තේ වතු සඳහා කණ්ඩායම් ක්‍රමයක් හඳුන්වා දීම - 1994

බණ්ඩාරපොල, ඇල්කඩුව, හුණුගල සහ පිටකන්ද වතුයායන් පිටකන්ද කණ්ඩායම ලෙසද රත්වත්ත සහ සැලගම වතුයායන් රත්වත්ත කණ්ඩායම ලෙසද ඒකාබද්ධ කරන ලදී.

1999 ජනවාරි 19 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කළමනාකරණ නියෝජිත ලෙස කළමනාකරණය භාර ගන්නා ලදී. 2002 අගෝස්තු මාසයේදී විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය කප්පාදු කල නිසා තේ කර්මාන්තශාලා 3ක් වැසී ගියේය. මෙය වර්තමාන අර්බුදයට මූලිකම හේතුව ලෙස සලකයි. තේ කර්මාන්තශාලා වැසීමට අමතරව ඇල්කඩුව වැවිලි සමාගමේ තේ දළු පිටස්තර තේ කර්මාන්තශාලා වෙත අලෙවි කිරීමට සිදුවිය.

2004 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගමේ පාලනය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහ වැවිලි කළමනාකරණ අධීක්ෂණ ඒකකය මඟින් පත්කළ ප්‍රධාන විධායක නිලධාරියෙකු මාර්ගයෙන් සිදු කරන ලදී.

2006 ජනවාරි මාසයේ සිට ආයතනය භාණ්ඩාගාරය මඟින් පත්වූ පූර්ණ කාලීන සභාපතිවරයෙකු සහ අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් කළමනාකරණය වේ.

2006 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගම විසින් බණ්ඩාරපොළ තේ කර්මාන්තශාලාව සී/ස ප්‍රයිඩ් ටී පුද්ගලික සමාගම වෙත අවුරුදු 30 කට බදු දෙන ලදී. ඒ අනුව ඇල්කඩුව වැවිලි සමාගම මඟින් නිෂ්පාදනය කරන තේ දළු වලින් වැඩි ප්‍රමාණයක් මෙම තේ කර්මාන්තශාලාව වෙත සපයන ලදී. 2015 වසරේදී සී/ස ප්‍රයිඩ් ටී පුද්ගලික සමාගම විසින් සැපයූ තේ දළු සඳහා ගෙවිය යුතු මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් ගිවිසුම අවලංගු කොට තේ කර්මාන්ත ශාලාව නැවත පවරා ගන්නා ලදී. හිඟ හිටි මුදල් අය කරගැනීම සඳහා නීති පති දෙපාර්තමේන්තුව හරහා සී/ස ප්‍රයිඩ් ටී පුද්ගලික සමාගම ට එරෙහිව නඩු පවරා ඇත.

2002 තෙක් ක්‍රියාත්මක වූ ඇල්කඩුව වැවිලි සමාගමේ රත්වත්ත සහ පිටකන්ද තේ කර්මාන්තශාලා දෙක විදුලි සැපයුම අත්හිටවීම හේතුවෙන් වැසී ගියේය.

2008 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගම විසින් රත්වත්ත තේ කර්මාන්ත ශාලාව මූලිකව අවුරුදු 10ක් සඳහා APN පුද්ගලික සමාගම නමැති පෞද්ගලික ආයෝජකයෙක් වෙත බදු දෙන ලදී. එම ආයෝජකයා කර්මාන්තශාලාවේ අලුත්වැඩියාවන් 2014 තෙක් සිදු කල අතර 2015 අවසාන භාගයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. තේ නිෂ්පාදනය සඳහා අමු දළු සැපයීම ඇල්කඩුව වැවිලි සමාගම විසින් සිදුකල අතර ඊට අදාළ මුදල් නොගෙවීම හා බදු කුලී නොගෙවීම හේතුවෙන් ගිවිසුම අවලංගු කොට තේ කර්මාන්ත ශාලාව නැවත පවරා ගන්න ලදී.


2013 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගම විසින් රත්වත්ත වතුයායට අයත් පන්සල්තැන්න තේ කර්මාන්තශාලාව සී/ස EOAS ඔර්ගනික්ස් (පුද්) සමාගම නමැති පුද්ගලික සමාගමට වසර 30 කට බදු දෙන ලදී. වාර්ෂික බදු කුලිය තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම්ව නිසි පරිදි ගෙවීම් සිදුකරමින් පවතී.

# මූල්‍ය ඉස්මතුකිරීම


| | 2018 | 2017 | විචලනය % |
|---|---|---|---|
| මුළු ආදායම (රු.) | 333,181,840 | 326,621,779 | 2% |
| දළ ලාභය/ (අලාභය) (රු.) | (66,181,368) | (28,228,102) | 134% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් (රු.) | 82,305,722 | 105,672,469 | -22% |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ලාභය | (28,905,729) | 39,849,864 | -173% |
| බදු රහිත ලාභය (රු.) | (33,622,259) | 37,088,310 | -191% |
| වාර්ෂික ලාභය (රු.) | (34,303,823) | 37,088,310 | -192% |
| දළ ලාභ ආන්තිකය (%) | (19.86%) | (8.6%) | 130% |
| ශුද්ධ ලාභ ආන්තිකය (%) | 10.3% | 11.3% | 61% |
| කොටසක ඉපයුම (රු.) | 3.37 | 11.69 | -71% |
| මුළු වත්කම් (රු.) | 1,203,985,035 | 1,131,187,393 | 6% |
| මුළු හිමිකම් (රු.) | 546,996,659 | 478,648,482 | 14% |
| නිකුත් කර ඇති කොටස් ගණන | නැත | නැත | නැත |
| කොටසක ශුද්ධ වත්කම | 30.39 | 26.59 | 14% |
| ජංගම අනුපාතය | 1: 0.45 | 1:0.35 | 2% |

ඉහත දත්ත 2018 දෙසැම්බර් 31 සහ 2017 දෙසැම්බර් 31 දින වලින් ගෙවුණු වර්ෂ සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් ලබා ගන්නා ලද අතර එය එකී මූල්‍ය ප්‍රකාශන වල අදාළ සටහන් සමඟ කියවිය යුතුය.


01





02




03




04



## මෙහෙයුම් ඉස්මතුකිරීම්

| | 2018 | 2017 | විචලනය % |
|---|---|---|---|
| තේ (දළු) නිෂ්පාදනය (කි.ග්‍රෑ) | 3,144,670 | 2,711,081 | 16% |
| NSA (රු.) | 86.89 | 91.09 | (5)% |
| COP (රු.) | 102.81 | 106.87 | (4)% |
| හෙක්ටයාරයකට අස්වැන්න | 781 | 644 | 21% |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 804.23 | 865.78 | |
| රබර් (කිරි) නිෂ්පාදනය (කි. ග්‍රෑ) | 98,988 | 77,348 | 26% |
| NSA (රු.) | 262.00 | 306.87 | (15)% |
| COP (රු.) | 446.51 | 481.32 | (6)% |
| හෙක්ටයාරයකට අස්වැන්න | 354 | 276.37 | 25% |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 278.85 | 276.36 | 0.9% |
| පොල් නිෂ්පාදනය (ගෙඩි) | 919,804 | 811,674 | 9% |
| NSA (රු.) | 35.24 | 42.10 | (13)% |
| COP (රු.) | 33.02 | 31.06 | 4% |
| හෙක්ටයාරයකට අස්වැන්න | 2,919 | 2671 | 9% |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 315.18 | 315.18 | |

## ලාභය/ (අලාභය) තත්ත්වය 1993-2018 (රු.)

| වර්ෂය | ලාභය / (අලාභය) | භාණ්ඩාගාර ප්‍රදාන | මුළු ලාභය/ (අලාභය) රු. |
|---|---|---|---|
| 1993 | (16,158,428) | - | (16,158,428) |
| 1994 | (44,076,870) | - | (44,076,870) |
| 1995 | (32,348,831) | - | (32,348,831) |
| 1996 | (43,109,305) | - | (43,109,305) |
| 1997 | (43,387,199) | - | (43,387,199) |
| 1998 | (41,795,687) | - | (41,795,687) |
| 1999(*) | (5,305,734) | - | (5,305,734) |
| 2000 | (16,884,862) | - | (16,884,862) |
| 2001 | (32,661,127) | - | (32,661,127) |
| 2002 | (72,197,231) | 168,072,927 | 95,875,696 |
| 2003 | (83,139,468) | 105,859,000 | 22,719,532 |
| 2004 | (78,472,241) | 76,100,000 | (2,372,241) |
| 2005 | (35,075,378) | 70,000,000 | 34,924,622 |
| 2006 | (49,489,141) | 55,000,000 | 5,510,859 |
| 2007 | (39,536,041) | 13,000,000 | (26,536,041) |
| 2008 | 29,490,317 | - | 29,490,317 |
| 2009 | (62,688,625) | - | (62,688,625) |
| 2010(**) | (4,965,702) | - | (4,965,702) |
| 2011 | (29,733,796) | - | (29,733,796) |
| 2012 | (35,168,337) | - | (35,168,337) |
| 2013 | (64,949,088) | - | (64,949,088) |
| 2014 | 30,402,163 | - | 30,402,163 |
| 2015 | (26,922,929) | 175,000,000 | 148,077,071 |
| 2016 | (62,756,178) | 75,831,000 | 13,074,822 |
| 2017 | 37,088,435 | 173,300,000 | 210,388,435 |
| 2018 | (34,303,823) | 95,000,000 | 60,696,177 |

- ගිණුම්ගත කරන ලද භාණ්ඩාගාර ප්‍රදාන වල මුළු වටිනාකම රු. 1,007,162,927/- කි.
- (*) හිටපු බැංකුකරුවන් වූ සෙලාන් බැංකුව මඟින් රු. මිලියන 25.9 ක් වූ සමුච්චිත පොලිය ලියාහැර දැමූ නිසා 1999 වසරේ අලාභය පහල ගියේය.
- (**) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල මඟින් උපචිත ණයකර පොලිය සඳහා අයකළ අධිභාරය වූ රු. මිලියන 35.06 ක් ලියාහැරීම හේතුවෙන් 2010 දෙසැම්බර් වන විට අලාභය අඩු විය.
- අදාළ වර්ෂ සඳහා පාරිබෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ අගය වෙනස් වීම (සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කල පසු) සහ සත්‍ය ලාභ අලාභ පහත පරිදි වේ.

2014 - රු. 84,630,003/- 2016 - රු. 5,982,775/- 2018 - රු. 4,163,665/-

2015 - රු. 680,621/- 2017 - රු. 51,235,672/-

## භාණ්ඩාගාරය මගින් ඇල්කඩුව වැවිලි සමාගම වෙත අරමුදල් නිදහස් කිරීම 1999 – 2018

| **වර්ෂය** | **විස්තරය** | **ප්‍රමාණය (රු.)** |
|---|---|---|
| 1993 – 2002 | උපචිත ශේෂය | 168,072,927 |
| 2003 | ලැබුණු අරමුදල් - පුනරාවර්තන | 105,859,000 |
| 2004 | ලැබුණු අරමුදල් - පුනරාවර්තන | 76,100,000 |
| 2005 | ලැබුණු අරමුදල් - පුනරාවර්තන | 70,000,000 |
| 2006 | ලැබුණු අරමුදල් - පුනරාවර්තන | 55,000,000 |
| 2007 | ලැබුණු අරමුදල් - පුනරාවර්තන | 13,000,000 |
| 2008 | - | - |
| 2009 | - | - |
| 2010 | - | - |
| 2011 | - | - |
| 2012 | - | - |
| 2013 | - | - |
| 2014 | - | - |
| 2015 | ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන | 175,000,000 |
| 2016 | ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන | 75,831,000 |
| 2017 | ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන | 173,300,000 |
| 2018 | ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන | 95,000,000 |
| **එකතුව** | | **1,007,162,927** |


## සභාපතිතුමාගේ සමාලෝචනය



2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ආයතනයේ සභාපති ලෙස මා විසින් 2020 පෙබරවාරි මස රාජකාරි භාරගෙන ආයතනයේ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරමි.

ඇල්කඩුව වැවිලි සමාගමෙහි පෙර කළමනාකරණ යටතේ, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමේදී සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් සිදු විය. කෙසේ වෙතත්, මෙම සමාගමේ සභාපතිවරයා ලෙස මා රාජකාරි භාරගත් පසු ඇල්කඩුව වැවිලි සමාගම් සාංගමික ව්‍යවස්ථාවලියේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන මත පදනම්ව වාර්ෂික වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා සහ කාලානුරූපව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මූලික කටයුතුගෙන ඇත.

ආයතනයේ සභාපතිවරයා ලෙස සහ ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාලෝචනයට භාජනය කල කාල පරිච්ඡේදය තුල ප්‍රධාන කාර්යාලයේ සහ වතුකරයේ කාර්ය මණ්ඩලයට සහ සේවකයින්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා මධ්‍යයේ වුවද ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා වූ කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.



**සුමිත් ජයරත්න**
**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**
**ඇල්කඩුව වැවිලි සමාගම**

# බාන්ඩික තොරතුරු

**තේ දළු**

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනය- කි.ග්‍රෑම් | 3,144,670 | 2,711,081 | 2,541,465 | 4,007,397 | 3,254,254 |
| NSA - රු/ කි.ග්‍රෑම් | 86.69 | 91.09 | 64.58 | 56.64 | 62.37 |
| COP - රු/ කි.ග්‍රෑම් | (102.81) | (106.87) | (87.11) | (68.32) | (89.41) |
| ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු. | (16.12) | (15.78) | (22.53) | (11.68) | (27.04) |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 804.23 | 865.78 | 862.78 | 883.18 | 1,278.39 |

**රබර් කිරි**

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනය- කි.ග්‍රෑම් | 98,988 | 77,348 | 75,949 | 82,085 | 93,876 |
| NSA - රු/ කි.ග්‍රෑම් | 262.00 | 306.87 | 211.34 | 239.74 | 249.69 |
| COP - රු/ කි.ග්‍රෑම් | (446.51) | (481.32) | (369.60) | (335.15) | (414.12) |
| ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු. | (184.51) | (174.45) | (158.26) | (95.41) | (164.43) |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 278.85 | 276.36 | 217 | 282.19 | 287.47 |

**පොල්**

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනය- ගෙඩි | 919,804 | 811,674 | 1,354,715 | 969,648 | 1,368,257 |
| NSA - රු/ ගෙඩි | 35.24 | 42.10 | 20.79 | 27.93 | 29.09 |
| COP - රු/ ගෙඩි | (33.02) | (31.06) | (14.10) | (9.53) | (10.31) |
| ලාභය/ (අලාභය) ගෙඩි 1කට රු. | 2.22 | 11.04 | 6.69 | 18.4 | 18.78 |
| ආදායම් උපයන බිම් ප්‍රමාණය - හෙක්ටයාර | 315.18 | 315.18 | 291.83 | 287.66 | 263.64 |

# අධ්‍යක්ෂ මණ්ඩලය

2018 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

1. නාලක දේවින්ද මඩවල මහතා (2018.11.15 දින දක්වා) - සභාපති/ අධ්‍යක්ෂ
2. සංජය ලීලාරත්න කන්කානම්ගේ (2018.11.16 දින සිට) - සභාපති/ අධ්‍යක්ෂ
3. රාමනායකගේ මල්ලිකා ජයන්ති මහත්මිය - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
4. ජෝන් මර්ටින්ස්ටයින් අල්පොන්සු ඩග්ලස් මහතා - අධ්‍යක්ෂ/ අමාත්‍යංශ නියෝජිත
5. වන්නකුවත්ත වඩුගේ රුචිර නිශාන්ත ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
6. රන්ජිත් අසෝක හේරත් මහතා - අධ්‍යක්ෂ
7. අස්වැද්දගේ ගෙදර විජේතුංග මහතා - අධ්‍යක්ෂ
8. අම්රා අක්බාර් මහත්මිය - අධ්‍යක්ෂ

සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ගණන 2 ට නොඅඩු විය යුතු අතර 7 ට වඩා වැඩි නොවිය යුතුය. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරනු ලබයි.

**අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින් "පත් කරන ලද අධ්‍යක්ෂකයින්" වන නිසා ඔවුන් ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යාම අවශ්‍ය නොවේ.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම**

අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ කාලත්‍රයින් ආයතනයේ කොටස් වලට හිමිකම් නොකියයි.

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ රුචිකත්වය**

සමාගම වෙත ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ ඍජු හෝ වක්‍රාකාර බලපෑමක් ඇති නොවේ.

## කළමනාකරණ කණ්ඩායම

**ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය**

සී. බී. නුගවෙල මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තේ)
කේ. බී. ආර්. පෙරේරා මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විවිධ භෝග)
රැඩ්ලි දිසාගේ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

**මධ්‍ය කළමනාකාරීත්වය**

ආර්.එම්.සී. විජේරත්න මහතා - මූල්‍ය කළමනාකරු
එච්.එම්. එස්. බී. නාරම්පනාව මහතා - කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන
ඩී.ඒ. ඩැනියල් මහතා - කළමනාකරු - MIS සහ විශේෂ ව්‍යාපෘති
ර්.එම්.ඒ.බී. ඒකනායක මහතා - අභ්‍යන්තර විගණක

**වතු කළමනාකාරීත්වය සහ අනෙකුත්**

**බණ්ඩාරපොල වතුයාය**

ආර්.ඒ.සී. පී. කුමාර මහතා - වතු අධිකාරී

**ඇල්කඩුව වතුයාය**

ආර්. දිසාගේ මහතා - වතු අධිකාරී
ඩී.එම්.එස්.ආර්. දිසානායක මහතා - සහකාර වතු අධිකාරී

**හුනුගල වතුයාය**

සී. බී නුගවෙල මහතා - වතු අධිකාරී (වැඩබලන)

**හපුගස්පිටිය වතුයාය**

කේ.බී.ආර්. පෙරේරා මහතා - වතු අධිකාරී
එන්.එච්.ඒ.බී. යාපා මහතා- සහකාර වතු අධිකාරී

**මිල්ලවාන වතුයාය**

ඩී.එස්.එන්. පෙරේරා මහතා - වතු අධිකාරී
කේ.ආර්.එස්.පී. ධර්මසේන මහතා - සහකාර වතු අධිකාරී
ඩී.ඒ.ටී.එස්. අතුකෝරල මහතා - සහකාර වතු අධිකාරී

**නාලන්ද වතුයාය**

එච්.ඒ.බී.එස්.එන්. උඩුගම මහතා - වතු අධිකාරී

සී.කේ.අලුවිහාරේ මහතා - සහකාර වතු අධිකාරී

**පිටකන්ද වතුයාය**

සී.බී.නුගවෙල මහතා - වතු අධිකාරී
කේ.පී.එන්.පී. කරුණාරත්න මහතා - සහකාර වතු අධිකාරී
සහන් රත්නායක මහතා - සහකාර වතු අධිකාරී

**රත්වත්ත වතුයාය**

එම්.එල්.කේ.ආර්. සේනාරත්න මහතා - වතු අධිකාරී
හෂාන් අකුරැටියගේ මහතා - සහකාර වතු අධිකාරී

**සැලගම වතුයාය**

එස්.කේ.ඩී.සී. නවරත්නම් මහතා - වතු අධිකාරී

## ආයතනික පාලන ප්‍රකාශය

ආයතනික පාලනය යනු සමාගමක් මෙහෙයවන සහ පාලනය කරන නීති, පුහුණුවීම් සහ ක්‍රියාවලි පද්ධතියයි. සමාගම මූලික වශයෙන් මෙහෙයවනු ලබන්නේ අඛණ්ඩතාවය, ආයතනික සාරධර්ම, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම මතයි. ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම පාලන මූලධර්ම සියලු පාර්ශවකරුවන් සහ සමාගම වෙනුවෙන් ක්‍රියාත්මක වන පරිසරය සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට උත්සහ කරන අතර සමාගමේ ක්‍රියාකාරකම්, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ පාර්ශවකරුවන්ගේ අභිප්‍රායන් අනුව සිදු කෙරේ. වගවීම් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වෙමින් නිවැරදි භූමිකාවන්, ව්‍යුහයන් සහ තොරතුරු මතින් ශක්තිමත් වන අතර මෙය ව්‍යාපාරයේ නියාමන අනුකූලතාවය සහ තිරසාර බව සහතික කිරීම සඳහා පමණක් නොව ව්‍යාපාර වටිනාකම ඉහල නැංවීම සඳහාද දායක වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂක මණ්ඩලය අවසානයේ සමාගමේ වගකීම දරනු ලබන අතර ආයතනික පාලන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වේ. ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ටතම භාවිතයන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇත.

**සංයුතිය**

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ.

**වගකීම**

එය ප්‍රධාන ප්‍රතිපත්ති සහ උපායමාර්ග අරමුණු සකසා ක්‍රියාත්මක කිරීම සහතික කරයි. මූල්‍ය තොරතුරු වල අඛණ්ඩතාවය සහ සමාගමේ අභ්‍යන්තර පාලනයේ පද්ධති වල ඵලදායීතාවය පිළිබඳ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම**

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මාසිකව පැවැත්වීමට නියම කර ඇත. මෙම රැස්වීම්වලදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගමේ උපායමාර්ගික දිශානතිය, වාර්ෂික අයවැය, සියලු ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සහ වර්තමාන සහ ප්‍රාග්ධන වියදම් වැඩසටහන් සමාලෝචනය කරයි. සෑම රැස්වීමකටම පෙර අදාළ ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙයි. 2018 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලය 05 වරක් රැස්වී ඇත.

**විගණන හා කළමනාකරණ කමිටුව**

ආයතනික පාලන මාර්ගොපදේශයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත් කරයි. මූල්‍ය වාර්තාකරණය, නෛතික හා නියාමන අනුකූලතා, අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සහ බාහිර විගනකවරුන් තක්සේරු කිරීම සමාලෝචනය කිරීමට විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුවේ සභාපති වන්නේ ශ්‍රී ලංකා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වේ. විගණන කමිටු රැස්වීම කාර්තු ලෙස පැවැත්වීමට තීරණය කර ඇත. ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන මණ්ඩල සාමාජිකයාගේ සභාපතීත්වය යටතේ විගණන කමිටු රැස්වීම නියාමනය කරනු ලබයි.

සාමාන්‍යාධිකාරීතුමා, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් සහ අනෙකුත් කළමනාකරුවන් ආරාධනය මත මෙම රැස්වීම් සඳහා සහභාගී වේ. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ආරාධනා සහ රැස්වීම් සම්බන්ධීකරණය කරයි. 2018 වර්ෂය තුල විගණන සහ කළමනාකරණ කමිටුව 04 වරක් රැස්වී ඇත.

**නීතිමය අවශ්‍යතාවයට අනුකූල වීම**

සමාගම් පනත සහ රජය සතු ව්‍යාපාර කටයුතු සඳහා අදාළ වන වෙනත් නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූල වන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සෑම උත්සාහයක්ම දරයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කර ඇති බවත් 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධි විධානයන්ට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි.

## අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ඇති විධිවිධාන වලට අනුකූලව ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිළිගනියි. විගණකාධිපති දෙපාර්තමේන්තුව ඔවුන්ගේ වාර්තා වල පිටු අංක 15 හි දක්වා ඇති වගකීම් වලට වඩා මෙම වගකීම් වෙනස් වේ.

මෙම වාර්තාවේ අන්තර්ගත සමාගමේ 2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කර ඇත. එමගින් 2007 අංක 7 දරණ ආයතන පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන් සහ කොළඹ කොටස් ගනුදෙනු වල නීති මගින් අපේක්ෂිත තොරතුරු සපයා ඇත. පිටු අංක 15 සිට 57 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර හා අඛණ්ඩව යොදා ගෙන ඇති බවත් අදාළ ගිණුම්කරණ සම්මතයන් අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි. මෙම සම්මත්යන්ගෙන් බැහැරව ඇති කරුණු ඇත්නම් ඒවා අනාවරණය කර විස්තර කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එළඹී තීරණ සහ තක්සේරු සාධාරණ සහ දූරදර්ශී වේ.

සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළි කරන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගැනීම සඳහා සමාගමට ඇති වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරයි. වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2018 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවටත් අවසන් වූ වර්ෂය සඳහා වූ ලාභය පිළිබඳවත් ඔවුන්ගේ වගකීම තහවුරු කරයි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය මත රඳා පවතියි. වැරදි අර්ථකතන හා වංචාවන්ට එරෙහිව නිරපේක්ෂ සහතිකයක් ලබා දිය හැකි තනි අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොමැති බව පිළිගන්නා අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර චෙක්පත්, අභ්‍යන්තර විගණනය, මූල්‍ය හා වෙනත් පාලනයන්ගෙන් සමන්විත වන අභ්‍යන්තර පාලන පද්ධති ඔවුන් විසින් ස්ථාපිත කර ඇති බව සනාථ කරයි. එමඟින් සියලු වත්කම් ආරක්ෂා කර ඇති බවට සාධාරණ සහතිකයක් පවතින අතර වැරදි අර්ථකථන සහ අක්‍රමිකතා සාධාරණ කාල සීමාවක් තුල වැලක්වීමට හෝ අනාවරණය කිරීමට හැකි වේ.

අනාගතයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩව අවධානය යොමු කිරීමේ පදනම භාවිතා කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරීන්ට ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා සුදුසු සහ අවශ්‍ය යැයි සලකන සමාලෝචන හා පරීක්ෂණ සිදු කිරීමට සෑම අවස්ථාවක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත. රජයේ විගනකවරුන් වන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලු මූල්‍ය වාර්තා හා අදාළ දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඔවුන්ගේ මතය මෙම වාර්තාවේ පිටු අංක 15 හි වාර්තා කර ඇත. මෙම මතයට පැමිණීමේදී ඔවුන් විසින් අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විමර්ශනය සාම්පල් පරීක්ෂා කිරීම තුලින් සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්



සමාගම් ලේකම්
ඇල්කඩුව වැවිලි සමාගම

## ඇල්කඩුව වැවිලි සමාගම

## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | දෙසැම්බර් 31 | |
|---|---|---|---|
| **වත්කම්** | **සටහන්** | **2018** | **2017** |
| **ජංගම නොවන වත්කම්** | | **රු.** | **රු.** |
| කල්බදු දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න | 01 | 149,212,360 | 153,511,897 |
| සින්නක්කර දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න | 02 | 52,630,160 | 51,661,316 |
| ධාරක ජීව විද්‍යාත්මක වත්කම් | 03 | 418,246,033 | 401,461,611 |
| පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් | 04 | 305,071,397 | 311,900,488 |
| මූල්‍ය ආයෝජන | 05 | 75,361,958 | 45,361,958 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,000,521,909** | **963,897,269** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 06 | 5,318,658 | 7,161,242 |
| විකුණුම් හා ලැබිය යුතු දේ | 07 | 127,756,894 | 105,996,004 |
| විලම්භිත බදු වත්කම් | 23.3 | 21,008,134 | - |
| මුදල් හා මුදල් වලට සමාන දේ | 08 | 49,379,440 | 54,132,879 |
| **මුළු ජංගම වත්කම්** | | **203,463,125** | **167,290,125** |
| **මුළු වත්කම්** | | **1,203,985,035** | **1,131,187,394** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනය | 09 | 180,000,010 | 180,000,010 |
| රඳවාගත් ඉපැයුම් | | 366,996,649 | 298,648,472 |
| **මුළු හිමිකම්** | | **546,996,659** | **478,648,482** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බදු කොන්දේසි මත බැදීම් - වත්මන් පරිනත | 10 | 732,317 | 37,425 |
| විලම්බිත ආදායම | 11 | 26,344,234 | 27,261,212 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් | 12 | 178,127,132 | 159,052,619 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **205,203,683** | **186,351,256** |
| **ජංගම වගකීම්** | | | |
| ගැනුම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 13 | 283,722,735 | 302,444,879 |
| සම්බන්ධිත පාර්ශව වෙත ගෙවිය යුතු ප්‍රමාණ | 14 | (24,359,001) | (11,737,220) |
| මුදවාලිය හැකි ණයකර | 15 | 5,000,000 | 5,000,000 |
| කෙටි කාලීන ණය | 16 | 83,505,208 | 67,178,460 |
| බදු කොන්දේසි මත බැදීම් - ශුද්ධ වත්මන් පරිනත | 10 | 552,615 | 1,357 |
| ගෙවිය යුතු පාරිතෝෂිකය | 12 | 103,363,136 | 103,300,180 |
| **මුළු ජංගම වගකීම්** | | **451,784,693** | **466,187,656** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,203,985,035** | **1,131,187,394** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සමඟ ගැළපේ.

..............................

මූල්‍ය කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වග කියයි.
ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

..............................

සභාපති/අධ්‍යක්ෂක

..............................

අධ්‍යක්ෂක

සටහන් අංක 1 සිට 27 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි.

**ඇල්කඩුව වැවිලි සමාගම**

**2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | | දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා | |
|---|---|---|---|
| | සටහන් | 2018 | 2017 |
| | | රු. | රු. |
| **ආදායම්** | **17** | **333,181,840** | **326,621,779** |
| විකුණුම් පිරිවැය | | (399,363,208) | (354,849,881) |
| **දල ලාභය/(අලාභය)** | | **(66,181,368)** | **(28,228,102)** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **18** | 82,305,722 | 105,672,469 |
| පරිපාලන වියදම් | **19** | (45,030,083) | (37,594,503) |
| **මෙහෙයුම් ලාභය/ අලාභය** | | **(28,905,729)** | **39,849,864** |
| අනෙකුත් වියදම් | **20** | (3,467,719) | (217,103) |
| **මූල්‍ය ගාස්තු වලට පෙර ලාභය/ (අලාභය)** | | **(32,373,448)** | **39,632,761** |
| මූල්‍ය ආදායම | **21** | 8,020,310 | 4,410,836 |
| මූල්‍ය වියදම | **22** | (9,269,121) | (6,955,287) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | | **(1,248,811)** | **(2,544,451)** |
| **බදු රහිත ලාභය/ අලාභය** | | **(33,622,259)** | **37,088,310** |
| ආදායම් බදු වියදම | **23** | (681,564) | - |
| **බදු සහිත ලාභය/ (අලාභය)** | | **(34,303,823)** | **37,088,310** |
| රජයේ දීමනා - පුනරාවර්තන | **24** | 95,000,000 | 173,300,000 |
| **වර්ෂය සඳහා ලාභය/ (අලාභය)** | | **60,696,177** | **210,388,310** |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | - | - |
| වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තීරණ ආදායම් එකතුව, බදු රහිත | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **60,696,177** | **210,388,310** |
| **කොටසක ලාභය - මූලික හා තනුක** | **25** | 3.37 | 11.69 |

**<u>2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය</u>**

| | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | **රඳවාගත් ඉපැයුම්** | **එකතුව** |
|---|---|---|---|
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 180,000,010 | 90,068,526 | **270,068,536** |
| එකතු: ඉකුත් වසර සඳහා ගැලපුම් | - | (1,808,489) | **(1,808,489)** |
| ප්‍රවර්තන වර්ෂයේ ලාභය | - | 210,388,435 | **210,388,435** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **180,000,010** | **298,648,472** | **478,648,482** |
| එකතු: ඉකුත් වසර සඳහා ගැලපුම් | - | 7,651,999 | **7,651,999** |
| වසර සඳහා මුළු විස්තීරණ ආදායම | - | 60,696,177 | **60,696,177** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **180,000,010** | **366,996,648** | **546,996,658** |

සටහන් අංක 1 සිට 27 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි.

**2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | දෙසැම්බර් වන විට | |
|---|---|---|
| | **2018** | **2017** |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| අඛණ්ඩ මෙහෙයුම් වලින් බදු රහිත ශුද්ධ අලාභය | (33,622,258) | 37,088,435 |
| අඛණ්ඩ නොවන මෙහෙයුම් වලින් බදු රහිත ශුද්ධ අලාභය | | - |
| **ගැලපුම්;** | | |
| පොලී ආදායම | (8,020,310) | (4,410,836) |
| ක්ෂයවීම සහ ක්‍රමක්ෂය | 7,476,451 | 8,433,680 |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා ප්‍රතිපාදන | 31,148,508 | 29,428,905 |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (916,978) | 916,978 |
| මූල්‍ය පිරිවැය | 9,269,121 | 6,955,287 |
| ජීව විද්‍යාත්මක වත්කම් බැහැර කිරීමේ ලාභය | (4,163,665) | (9,769,109) |
| ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම මත ලාභය/අලාභය | | (33,335,172) |
| ඉකුත් වසරේ ගැලපුම් | (13,356,135) | (1,808,489) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | (12,185,265) | 43,268,768 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | 1,842,584 | (1,265,218) |
| වෙළඳාම් හා අනෙකුත් ලැබිය යුතු දේ වැඩිවීම/ (අඩුවීම) | (21,760,890) | (98,916) |
| වෙළඳාම් හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ (අඩුවීම) | (18,722,144) | (123,764,755) |
| අදාළ සමාගම් වලට ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම) | (12,621,781) | (14,770,946) |
| ජනනය වූ/ (භාවිත කල) මුදල් | (63,447,496) | (96,631,069) |
| ගෙවූ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් | (12,011,039) | (4,181,122) |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (6,994,782) | (5,355,287) |
| **මෙහෙයුම් වලින් ලද/ (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(82,453,317)** | **(106,167,478)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද/ (භාවිත කල) මූල්‍ය ප්‍රවාහ** | | |
| ජීව විද්‍යාත්මක වත්කම් විකිනීම | 10,992,755 | 17,900,500 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | (30,000,000) | (989,148) |
| ස්ථාවර තැන්පත් පොලී අදායම් ලැබීම් | 4,624,896 | 3,110,511 |
| දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න මිලට ගැනීම | (20,930,134) | (23,423,897) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද/ (භාවිත කල) ශුද්ධ මුදල්** | **(35,312,483)** | **(3,402,034)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද/ (භාවිත කල) මූල්‍ය ප්‍රවාහ** | | |
| මූල්‍ය බදු ගෙවීම | 1,685,667 | - |
| ලද භාණ්ඩාගාර ප්‍රදානයන් | 95,000,000 | 173,300,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද/ (භාවිත කල) ශුද්ධ මුදල්** | **96,685,667** | 173,300,000 |
| මුදල් හෝ සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (21,080,134) | 43,708,626 |
| වසර ආරම්භයේ මුදල් හෝ සමාන දෑ | 9,705,039 | (34,003,533) |
| **වසර අවසානයේ මුදල් හෝ සමාන දෑ A** | **(11,375,095)** | **9,705,093** |

**සටහන (A)**

**මුදල් හෝ මුදල් වලට සමාන දෑ**

| | **2018** | **2017** |
|---|---|---|
| **හිතකර ශේෂයන්** | | |
| බැංකුවේ ඇති මුදල් - ප්‍රධාන ශාඛාව | 47,975,111 | 52,686,916 |
| බැංකුවේ ඇති මුදල් - වතුයාය | 1,080,945 | 994,931 |
| අතැති මුදල්/ මුද්දර | 323,383 | 451,032 |
| | 49,379,440 | 54,132,879 |
| බැංකු අයිරා | 60,754,534 | 44,427,786 |
| **අවසන් ශේෂය** | **(11,375,094)** | **9,705,093** |

සටහන් අංක 1 සිට 27 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි.

## ඇල්කඩුව වැවිලි සමාගම
### ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1. ආයතනික තොරතුරු**

**1.1 වාසස්ථාන හා නෛතික ආකෘතිය**

ඇල්කඩුව වතු සීමාසහිත සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනතේ සංස්ථා පරිවර්තනය කිරීමේ විධිවිධාන සහ 1987 අංක 2 දරණ පොදු සමාගම් පනත යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ ස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 320, "ජනවතුපියස", ටී.බී ජයා මාවත, කොළඹ 10 ස්ථානයේ පිහිටා ඇති අතර වතුයාය, මාතලේ හා කුරුණෑගල වගා කරන ප්‍රදේශ වල පිහිටා ඇත.

**1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

වර්ෂය තුල සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ තේ, රබර්, පොල්, කොකෝවා හා අනෙකුත් කෘෂි භෝග වගාකිරීම, නිෂ්පාදනය සහ අලෙවිකිරීම වේ.

**1.3 මව් ව්‍යවසායයන්**

සමාගමේ මව් හා පරිපාලන පාර්ශවය ශ්‍රී ලංකා රජය වේ.

**2. සූදානම් වීමේ පදනම**

**2.1 ආකූලතා ප්‍රකාශය**

ඇල්කඩුව වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) මඟින් නිකුත් කල ශ්‍රී ලංකා වාර්තාකරණ සම්මතයන්ට (SLFRS/LKAS) ට අනුකූල විය යුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන් සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි සකස් කර ඇත.

**2.2 ඇගයුම් පදනම**

පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනත් ආකාරයකින් දක්වා ඇති ස්ථාන හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික වියදම් ගිණුම් පදනම් කර ගෙන සකස් කර ඇත.

**2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සඳහන් කර නොමැති නම් ආසන්න රුපියලට ඉදිරිපත් කරයි.

**3. තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රෙගුලාසි ආදේශනයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ වාර්තා කිරීමට බලපෑ හැකි තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකරණයක් අවශ්‍ය වේ. තීරණ හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ අතීත අත්දැකීම් සහ එම තත්ත්වය යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන වෙනත් විවිධ සාධක මත වේ. එම නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒ හා සම්බන්ධ උපකල්පන අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. සංශෝධන බල පැවැත්වෙන්නේ එම කාල සීමාව සහ අනාගත කාල පරිච්ඡේදය සඳහා පමණක් නම් ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල සීමාව තුල ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු තක්සේරුකරණ අවිනිශ්චිතතාවයට සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් වල ඇතුලත් වේ.

### 3.1 ආදායම් බදු

ආදායම් බදු තක්සේරු මත පදනම්ව අපේක්ෂිත බදු පිළිබඳ වගකීම සමාගම විසින් හඳුනා ගනියි. මෙම සිද්ධි වල අවසාන බදු මුදල මූලකව වාර්තා කල අගයට වඩා වෙනස් වූ විට එවැනි වෙනසක් සිදු කරනු ලබන කාල පරිච්ඡේදය තුල වර්තමාන සහ විලම්භිත ආදායම් බදු, වත්කම් හා වගකීම් කෙරෙහි බලපානු ඇත.

### 3.2 විශ්‍රාමික වරප්‍රසාද සඳහා වන බැදීම

විශ්‍රාමික වරප්‍රසාද සඳහා වන බැදීම් වල වර්තමාන අගය, උපකල්පන භාවිතා කරමින් ක්‍රියාකාරී පදනම මත තීරණය වන සාධක ගණන මත පදනම් වේ. විශ්‍රාමික වරප්‍රසාද සඳහා වන බැදීම් තීරණය කිරීමේදී යොදා ගත් මූලික උපකල්පන සටහන 12 හි දක්වා ඇත. මෙම උපකල්පන වල ඇතිවන වෙනස්කම් විශ්‍රාමික වරප්‍රසාද සඳහා වන බැදීමේ රැගෙන යාමේ අගයට බලපෑම් ඇති කරයි.

### 3.3 ජීව විද්‍යාත්මක වත්කම්

කළමනාකරණය කරන ලද තේක්ක ශාක වල සාධාරණ වටිනාකම විවිධ මූල්‍යමය සහ මූල්‍යමය නොවන උපකල්පන භාවිතා කල වට්ටම් ක්‍රමයක් මත තීරණය කල කරුණු ගණනාවක් මත පදනම් වේ. ශාක වල වර්ධනය කිසිසේත් නිගමනය කල නොහැකි ජීව විද්‍යාත්මක සාධක මඟින් තීරණය කරන ලදී. උපකල්පන වල යම් වෙනස්කම් ඇත්නම් ඒවා ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ අගයට බලපෑම් ඇති කරයි.

### 3.4 කීර්තිනාමය දුර්වල වීම

අවම වශයෙන් වාර්ෂික පදනමින් කීර්ති නාමය දුර්වල වී ඇති බව කණ්ඩායම තීරණය කරයි. මේ සඳහා කීර්ති නාමය සඳහා වෙන් කර ඇති මුදල් උත්පාදන ඒකකයේ “භාවිතයේ වටිනාකම” තක්සේරු කිරීම අවශ්‍ය වේ. එම මුදල් උත්පාදන ඒකකයේ වටිනාකම තක්සේරු කිරීම සහ එම මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම සංසරණය කිරීම සඳහා සුදුසු වට්ටම් අනුපාතිකයන් තෝරා ගැනීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් වර්තමාන සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට හිතකර ශේෂයන් නොමැත.

### 3.5 විලම්බිත බදු වත්කම්

භාවිතයට නොගත් බදු අලාභයන් සඳහා විලම්බිත බදු වත්කිං හඳුනාගෙන ඇති අතර, බදු අයකළ හැකි ලාභය ලබා ගත හැකි ඒවාට එරෙහිව පාඩුව ලැයිස්තුගත කල නොහැක. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය ගණනය කිරීමට සැලකිය යුතු කළමනාකරණ තීරණයක් අවශ්‍ය වන අතර එය කාලය, අනාගත බදු ගෙවිය යුතු ලාභය සහ අනාගත බදු සැලසුම් ක්‍රියාවලි මත පදනම් විය යුතුය.

## 4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සඳහන් ඒවාට අමතරව, ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය වසරේ භාවිතා කල ඒවාම වේ. මෙම අවසරේ ඉදිරිපත් කිරීමට යෝග්‍ය වන ලෙස සංසන්ධානාත්මක තොරතුරු අවශ්‍ය පරිදි නැවත වර්ගීකරණය කර ඇත. අධ්‍යක්ෂවරුන් විසින් සමාගම ඉදිරි අනාගතය වෙත පවත්වාගෙන යාම පිළිබඳ ඇගයුමක් සිදු කර ඇති අතර වෙළඳාම අවසායනය හෝ නැවත්වීම අවශ්‍ය බව ඔවුන් පුරෝකථනය නොකරයි.

### 4.1 වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල් හා බැංකු ශේෂයන් හා සමාගම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක් තුල හෝ වාර්තා කරන දින සිට අවුරුද්දක් ඇතුළත ඉක්මන්ම දිනයකදී මුදල් බවට පත් කල හැකි දේ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දින සිට එක කාල සීමාවක් ඉක්මවා තබා ගත හැකි වත්කම් වේ.

#### 4.1.1 දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න

**a) හඳුනා ගැනීම හා ඇගයීම**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න ගණනය කිරීම, පිරිවැය තක්සේරු කිරීමෙදී ලබන අගයෙන් සමුච්චිය ක්ෂයවීම් සහ සමුච්චිත හානිපාඩු අඩු කිරීම මඟින් සිදු කරයි.

**b) හිමි වත්කම්**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල පිරිවැය යනු වත්කම් හිමිකර ගැනීමට ඍජුවම ආරෝපණය වන වියදම් වේ. එම වියදම් වලට දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වලට අලුතින් කොටස් දැමීම සඳහා වැයවන මුදල් සහ පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම් දිගු කාලීන ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ණය ගැනීමේ පිරිවැය වේ. ස්වයං සාදන ලද වත්කම් වල පිරිවැයට, ද්‍රව්‍ය වල පිරිවැය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් වැඩ කරන තත්ත්වයට ගෙන ඒමට ඍජුවම ආරෝපණය වන පිරිවැය සහ එම භාණ්ඩ විසුරුවා හැර ඉවත් කිරීමට හා ඒවා පිහිටා තිබූ භූමිය නැවත සජ්කස් කිරීමට වැයවන මුදල අන්තර්ගත වේ.

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල සැලකිය යුතු කොටස් විවිධ කාල පරිච්ඡේද වලදී නැවත දැමීමට සිදු වන විට එම කොටස් ස්වාධීන වත්කම් ලෙස සලකන අතර ඒවාට විශේෂිත භාවිතා කල හැකි කාලයන් සහ ක්ෂයවීම් ඇති බව සලකයි. එලෙසම ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරන විට හඳුනා ගැනීමේ ක්‍රමවේදය තෘප්තිමත් නම් යන්ත්‍රෝපකරණ හා ආම්පන්න වල රැගෙන යාමේ පිරිවැයහි ප්‍රතිස්තාපනයක් ලෙස හඳුනා ගත හැක. අනෙකුත් සියලු අලුත්වැඩියා හා නඩත්තු මූල්‍ය ප්‍රකාශයේ දක්වා ඇත. ප්‍රතිපාදනයන් සඳහා පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම් වත්කම් භාවිතයෙන් පසු එය ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වර්තමාන වටිනාකම අදාළ වත්කම් වල පිරිවැයට ඇතුලත් වේ.

ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන කටයුතු පළමු උපයෝගීතාවයේදී හෝ වත්කම් ආරම්භ කරන අවස්ථාවේදී අදාළ වත්කම් ගිණුම් වෙත මාරු කරනු ලැබේ.

**c) බදු වත්කම්**

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වත්කම්, කල්බදු වත්කම් වල හිමිකරීත්වයට ඇති අවධානම සහ ප්‍රතිලාභ සියල්ලම සලකනු ලබන්නේ ඒවා සම්පූර්ණයෙන්ම මිලදී ගෙන ඇති ලෙස සහ ඒවායේ

මූල්‍යමය අගයට ප්‍රාග්ධනීකරණය කර ඇති ලෙසය. කල්බදු ලෙස හිමිකරගත් වත්කම් මගිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයේ පහල අගයට සමාන වන ලෙස සහ පරික්ෂාවේ අවම බදු ගෙවීමෙන් ක්ෂයවීම් සහ අපහායනය අඩු කිරීමෙන් වේ.

කල්බදු සීමාව අවසන් වන විට එම හිමිකාරීත්වය පැවරෙන්නේ නැත්නම් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ඇති වත්කම් කල්බදු කාල සීමාව හෝ සමාන හිමිකාරී වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ. බදුකරුට ගෙවිය යුතු ප්‍රාග්ධන අංග වගකීම් ලෙස දැක්වේ. බදු ගෙවීම ප්‍රාග්ධන හා පොලී අයිතම වල ස්ථිරතාව ලෙස සලකයි. හිඟ වගකීම සහ පොලී අඩු කිරීම සඳහා යොදන කුලී ප්‍රාග්ධන මූලද්‍රව්‍ය ලාභයට එරෙහිව අය කරනු ලැබේ.

බදු දේපලක් වැඩිදියුණු කිරීමේ වියදම් ලෙස දක්වා ඇත්තේ ප්‍රාග්ධනීකරණය කල බදු දේපලක් බදු කාල සීමාව තුල ක්ෂයවීම හෝ වැඩිදියුණු කිරීම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත වේ.

**d) පසු කාලීන වියදම්**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නයක කොටසක් නැවත ප්‍රතිස්ථාපන කිරීම මගින් සමාගම වෙත අනාගතයේදී ආර්ථික ප්‍රතිලාභ ගලා එයි නම් එය එහි වටිනාකම තුලින් හඳුනාගෙන ඇති අතර එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කල කොටසේ රැගෙන යන වටිනාකම පනත හඳුනානොගත් ප්‍රතිපත්තිය අනුව තීරණය වේ. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න එදිනෙදා සේවා කිරීම ලාභ අලාභ වල දක්වා ඇත.

**e) නොසලකා හැරීම**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල රැගෙන යන වටිනාකම එමගින් අනාගත ආර්ථික ප්‍රතිපාදන නොමැති විට හෝ භාවිතයෙන් ඉවත් කරන විට නොසලකා හරිනු ලැබේ. ලැබීම් හෝ වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ දක්වා ඇති අතර ලැබීම් ආදායම් යටතේ වර්ගීකරණය කර නොමැත.

**f) ක්ෂයවීම**

ක්ෂයවීම, දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලයට වඩා සෘජුවම ලාභය/ අලාභය ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත. කල්බදු කාල සීමාව අවසන් වන විට සමූහයට හිමිකාරීත්වයක් ඇති බවට සාධාරණ ලෙස විශ්වාස කල නොහැකි නම්, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ඇති වත්කම් කල්බදු කාල සීමාව සහ සමාන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත සඳහා ක්ෂය කරනු ලැබේ. SLSPC/JEDB මගින් ලබා ගත් ඉඩමේ බදු කාලය 2036න් අවසන් වේ. වර්තමාන හා විස්තීරණ කාල පරිච්ඡේද වල ඇස්තමේන්තුගත ඵලදායී කාල පහත පරිදි වේ.

| **භාණ්ඩය** | **අවුරුදු ගණන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි සඳහා වැඩිදියුණු කිරීම් | වසර 40 | 2.5% |
| යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න | වසර 13 1/3 | 7.5% |
| සනීපාරක්ෂක ජලය සහ විදුලි සැපයුම | වසර 20 | 5% |
| මෝටර් වාහන | වසර 5 | 20% |
| ආම්පන්න | වසර 8 | 12.5% |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | වසර 10 | 10% |

**මේරූ වතු - නැවත වගා කිරීම සහ අලුතින් වගා කිරීම**

| **භාණ්ඩය** | **අවුරුදු ගණන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| තේ | වසර 33 1/3 | 3% |
| රබර් | වසර 20 | 5% |
| පොල් | වසර 50 | 2% |
| කොකෝවා | වසර 50 | 2% |

වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි විට වන අතර වත්කම ක්ෂය කිරීම, ඒවා විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති දිනට පෙර නතර වේ. අවශ්‍යනම් ක්ෂය වන ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අබිලි ද්‍රව්‍ය වල වටිනාකම අදාළ නම් වාර්තා කරන දිනයේදී නැවත ඇගයුමකට ලක් කිරීම සිදු කරයි. මෙරු වතු ක්ෂයවීම ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාල පුරා හෝ කල් ඉකුත් නොවූබදු කාල සීමා පුරා අඩු කාලයක් පවතින ලෙස සිදු වේ. නොමෙරු වතු සඳහා ක්ෂයවීමක් දක්වා නොමැත.

**g) ක්‍රමක්ෂය**

SLSPC/JEDB වෙතින් පවරා ගත වත්කම් සඳහා කල්බදු ඵෙතිය ඉතිරිව ඇති කල්බදු කාලය හා ප්‍රයෝජනවත් ජීවිත වලට වඩා සමාන ප්‍රමාණයකින් ක්‍රමක්ෂය කර ඇත.

| **බාණ්ඩය** | **අවුරුදු ගණන** | **ප්‍රතිශතය** |
|---|---|---|
| කල්බදු දේපල | වසර 53 | 1.89% |
| භූමිය වැඩිදියුණු කිරීමේ වියදම් | වසර 30 | 3.33% |
| ගොඩනැගිලි | වසර 25 | 4% |
| යන්ත්‍රෝපකරණ හා මෙවලම් | වසර 5 | 20% |
| ජල ව්‍යාපෘති සහ සනීපාරක්ෂාව | වසර 35 | 2.85% |
| මාර්ග වැඩිදියුණු කිරීම | වසර 30 | 3.33% |
| මේරූ වතු - තේ සහ රබර් | වසර 30 | 3.33% |
| මේරූ වතු - අනෙකුත් | වසර 25 | 4% |

### 4.1.2 භූමි සංවර්ධන වියදම්

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය යනු නව ප්‍රවේශ මාර්ග සහ අනෙකුත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කල්බදු ඉඩම් සමෝච්චයන්හි වෙනස්කම් සිදු කිරීමට දරණ ලද පිරිවැයයි. මෙම වියදම්, පවතින බදු කාලය තුල ප්‍රාග්ධනීකරණය හා ක්ෂය කිරීම සිදු කරනු ලැබේ.

ඉඩම් වැඩිදියුණු කිරීමේ ස්ථිර දුර්වලතා අලාභය නිශ්චය කිරීමෙන් පසු සිදු වූ වර්ෂයේදී එම වත්කම් සඳහා සම්පූර්ණ හෝ ශුද්ධ වත්කම් සහිත ආදායම් ප්‍රකාශ වලදී අය කිරීම සිදු වේ.

### 4.1.3. ජීව විද්‍යාත්මක වත්කම්

**නොමේරූ සහ මේරූ වගාවන්**

ජීව විද්‍යාත්මක වත්කම් මේරූ ජීව විද්‍යාත්මක වත්කම් සහ නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මේරූ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හැඳින්වෙන්නේ අස්වැන්න නෙළිය හැකි පිරිවිතර සහිත හෝ නිතිපතා අස්වැන්න නෙලිය හැකි මට්ටමේ ඒවා වේ. නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් යනු නිතිපතා අස්වැන්න නෙලිය හැකි මට්ටමට ළඟා නොවූ ඒවා වේ. රබර්, තේ සහ අනෙකුත් වතු සහ තවාන් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

ජීව විද්‍යාත්මක වත්කම් තවදුරටත් දරණ ජීව විද්‍යාත්මක වත්කම් සහ පාරිභෝගික ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. දරණ ජීව විද්‍යාත්මක වත්කම් වලට ඇතුලත් වන්නේ විකිණීම සහ අස්වැන්න නෙලීම සිදු කල නොහැකි රබර්, තේ පැළ සහ පොල් පැළ වේ. කෙසේ වෙතත් ඒවා කෘෂිකාර්මික නිෂ්පාදන අස්වැන්න නෙළීම සඳහා හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස විකුණනු ලැබේ.

ආයතනය ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගන්නා අතර, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්කම් පාලනය කරන විට පමණක්, වත්කම් සමඟ ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා යා හැකි අතර වත්කම්වල සාධාරණ වටිනාකම විය හැකිය විශ්වසනීයව මනිනු ලැබේ.

දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් මැනීම LKAS 16 යටතේ අර්ථදක්වා ඇති දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න යටතේ ඇති ජීව විද්‍යාත්මක වත්කම් වල ක්ෂය වීම හා මූලික හඳුනා ගැනීම ශ්‍රී ලංකා

වරලත් ගණකාධිකරණ ආයතනය සපයා ඇති තීන්දුවට අනුකූලව පිරිවැයෙන් සමුච්චිත හානි සහ පාඩු අඩු කිරීම මගිනි.

කළමනාකරණය කරන ලද දැව මැනීම, මූලික හඳුනා ගැනීමකින් සහ සෑම වාර්තාකරණ කාල සීමාවකම අවසානයේ LKAS 41 ට අනුව එහි සාධාරණ අගයෙන් විකිණීම සඳහා දැරීමට සිදු වූ පිරිවැය අඩු කිරීමෙන් සිදු කරයි. පිරිවැය ළපටි පැළෑටිවල සාධාරණ වටිනාකමෙහි ආසන්න අගයක් ලෙස සලකනු ලබන්නේ මෙම ශාකවල ජීව විද්‍යාත්මක පරිවර්තනයට මෙම කාල පරිච්ඡේදය මිල කළ නොහැකි ලෙසය. දැව ගස්වල සාධාරණ වටිනාකම මනිනු ලබන්නේ ස්වාධීන වෘත්තීය තක්සේරුකරුගේ විසින් පරිණත අවස්ථාවේ දී ගස්වල අපේක්ෂිත දැව අන්තර්ගතයට අදාළ වන දැව වල වර්තමාන වෙළඳපොල මිල ගණන් සැලකිල්ලට ගනිමින් DFC ක්‍රමයෙනි.

### DFC ක්‍රමයේ ප්‍රධාන විචල්‍ය

| විචල්‍ය | අදහස |
|---|---|
| මුදල් තක්සේරුව | |
| දැව ප්‍රමාණය | වට ප්‍රමාණය, උස සහ විවිධ භූගෝලීය කලාපවල එක් එක් විශේෂවල වර්ධනය සැලකිල්ලට ගනිමින් භෞතික සත්‍යාපනය මත පදනම්ව ඇස්තමේන්තු කර ඇත. සමාගමේ වන වගා සැලැස්ම හා දැව අස්වැන්න නෙළීමට එරෙහිව බලාත්මක කර ඇති සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසිවලට සාධකය |
| ආර්ථික ප්‍රයෝජනවත් ජීවිත | සමාගමේ වන වගා සැලැස්ම සකස් කිරීම මගින් එක් එක් විශේෂයේ සාමාන්‍ය ආයු කාලය මත පදනම්ව ඇස්තමේන්තු කර ඇත |
| විකුණුම් මිල | පවත්නා ශ්‍රී ලාංකීය වෙළඳපල මිල මත පදනම්ව ඇස්තමේන්තු කර ඇත. ගස් කැපීම සඳහා සපුරාලිය යුතු සියලු කොන්දේසි සාධකය. |

පැළ තවාන් වියදම් වලට සෘජු ද්‍රව්‍ය, සෘජු සේවකයින් සහ සෘජුවම ආරෝපණය කළ හැකි පොදු කාර්ය අන්තර්ගත වන අතර අධිවර්ධිත ශාක වල ප්‍රතිපාදන අඩු විය යුතුය.

ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයක මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව ලැබීමෙන් හෝ වියදම් වීමෙන් ජීව විද්‍යාත්මක වත්කම් විකිණීමට වැයවන පිරිවැය අඩු කල විට ලැබෙන අගය අදාළ කාලයේ ලාභ අලාභ වල දක්වා ඇත.

### 4.1.4 හිස් ජීව විද්‍යාත්මක වත්කම් සඳහා පිරිවැය පිරවීම

පෙරදී සිදු කරන ලද බිම් පිරවුම් කාර්ය සාධන ඇගයීමට වඩා අපේක්ෂිත අනාගත වාසිදායක තත්ත්වයන් වැඩි, මේරූ ක්ෂේත්‍ර සඳහා බිම් පිරවුම් ලෙස භූමිය සංවර්ධනය වැය වන මුදල් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අදාළ මේරූ වතුයායේ ප්‍රයෝජනවත් ආර්ථිකයක් ඉතිරිව පවතින නව වත්කම් හෝ අපේක්ෂිත බදු කාලය අඩු නම් පිරවුම් වියදම් ක්ෂය වේ.

පිරවුම් වියදම් ප්‍රාග්ධනීකරණය කර නොමැති නම් ඒවා සිදු කල වසරේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 4.1.5 ණයට ගැනීමේ පිරිවැය

ප්‍රාග්ධනීකරණය කර නොමැති ණයට ගැනීමේ පිරිවැය ඒවා සිදු කල කාල පරිච්ඡේදය තුල වියදම් ලෙස හඳුනා ගෙන ඇති අතර ඒවා ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

### 4.1.6 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම යනු භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයුම, කුලී හෝ පරිපාලනමය අරමුණු සඳහා භාවිතා කිරීම සඳහා තබා ඇති භෞතික ද්‍රව්‍යයක් නොමැතිව හඳුනාගත හැකි මූල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායයට ගලා යා හැකි නම් වන අතර අස්පෘශ්‍ය වත්කම් මත LKAS 38 ට අනුකූලව වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකිය.

වෙන වෙනම අත්පත් කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් මනිනු ලබන්නේ පිරිවැය මූලින් හඳුනා ගැනීම මතය. ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැය වන්නේ අත්පත් කරගත් දිනයේ ඒවායේ සාධාරණ අගය වේ. පිරිවැයෙන් ක්ෂයවීම් සහ හානි පාඩු ඇත්නම් ඒවා අඩු කර අස්පෘශ්‍ය වත්කම් මූලිකව හඳුනා ගැනේ. ප්‍රාග්ධනීකරණය කල සංවර්ධන වියදම් හැර මූලිකව ජනනය වූ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කර නොමැති අතර වියදම සිදු වූ වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශයෙන් පිළිබිඹු වේ.

අස්පෘශ්‍ය වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත සීමිත හෝ අවිනිශ්චිත ලෙස අගයා ඇත.

අස්පෘශ්‍ය වත්කම් අඩපණ විය හැකි බවට ඇඟවීමක් ඇති විට සීමිත ජීවිත සහිත අස්පෘශ්‍ය වත්කම් ඔවුන්ගේ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත හා හානිය සඳහා වත්කම් මත ක්‍රමක්ෂය කරනු ලැබේ. අවිනිශ්චිත ආර්ථික ජීවිතයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර නැති අතර, නමුත් තනි තනිව හෝ මුදල් උත්පාදනය කරන ඒකක මට්ටමින් වාර්ෂිකව හානිය සඳහා පරීක්ෂා කරනු ලැබේ. සීමිත හා අවිනිශ්චිත ප්‍රයෝජනවත් ජීවිත සමඟ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ කාලය සහ ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

**පර්යේෂණ සහ සංවර්ධන පිරිවැය**

නව නිශ්චිත හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වන වියදම්, ලාභය හෝ අලාභය තුලින් හඳුනා ගැනේ.

සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා නව හෝ සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළ නිෂ්පාදන හා ක්‍රියාවලිය සඳහා සැලැස්මක් හෝ නිර්මාණයක් ඇතුළත් වේ. සංවර්ධන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ සංවර්ධන පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම්, නිෂ්පාදිතය සහ ක්‍රියාවලිය තාක්‍ෂණිකව හා වාණිජමය වශයෙන් කළ හැකි නම්, අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි අතර, සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ වත්කම් භාවිතා කිරීමට හෝ විකිණීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතු නම්ය.

ප්‍රාග්ධනීකරණය කල වියදමට අන්තර්ගත වන්නේ ද්‍රව්‍ය වල, සෘජු සේවකයින් සහ අදාළ භාවිතයන් සඳහා වත්කම් සැකසීමේදී වයවය පොදු කාර්ය පිරිවැය වේ. අනෙකුත් සංවර්ධන වියදම් සිදු වී ඇත්නම් ලාභ අලාභ වල දක්වා ඇත.

ප්‍රාග්ධනීකරණය කල සංවර්ධන වියදම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු අඩු කිරීමෙන් වේ.

### 4.1.7 මූල්‍ය උපකරණ

#### 4.1.7.1 මූල්‍ය වත්කම්

LKAS 39 විෂය පථය තුල ඇති මූලික හඳුනාගැනීම සහ මූල්‍ය වත්කම් මැනීම ලාභ හෝ අලාභ, ණය හා ලැබිය යුතු මුදල්, කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන, විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් හෝ කොටුකිරීමේ උපකරණ ලෙස නිම්ති කල දේ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී මණ්ඩලය විසින් එහි වර්ගීකරණය සිදු කරනු ලැබේ.

සියලු මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර ලාභය හෝ අලාභය ලෙස සාධාරණ වටිනාකමකින් නොමැති වත්කම් සඳහා ගනුදෙනු පිරිවැය යොදා ගනියි. සමාගමේ මූල්‍ය වත්කම් වලට මුදල්, කෙටි කාලීන තැන්පතු, කෙටි කාලීන ආයෝජන, විකුණුම් සහ අනෙකුත් ලැබිය යුතු ආදායම් සහ ණය සහ ලැබිය යුතු ආදායම්, අයත් වේ.

#### 4.1.7.2 ලාභ අලාභ වල සාධාරණ අගයේ ඇති මූල්‍ය වත්කම්

ලාභය හා අලාභය තුලින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් වලට වෙළදාම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ මිලදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළදාම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කර ඇත.

සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්ත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇති අතර ආදයම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදු වූ වෙනස්කම් දක්වා ඇත.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත සමාගම කිසිදු මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

#### 4.1.7.3 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ක්‍රියාකාරී වෙළඳපොලක සඳහන් නොවන ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් අඩු අපහායනය සහිත කාර්යක්ෂම පොලී අනුපාත ක්‍රමයක් යටතේ (EIR) ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ අන්තර්ගත කර ඇත. හානිය නිසා ඇති වන පාඩු මූල්‍ය පිරිවැයේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

වෙළඳ ලැබිය යුතු දේ, අදාළ පාර්ශවයන්ගෙන් ගෙවිය යුතු මුදල්, තැන්පතු, අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු දේ සහ මුදල් වලට සමාන දේ වලින් ණය හා ලැබිය යුතු දේ සමන්විත වේ.

#### 4.1.7.4 කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන

සමූහයට ධනාත්මක අභිප්‍රාය සහ පරිණතභාවයට පත්වීමේ හැකියාව ඇති විට ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහ ස්ථාවර කල් පිරීම් සහිත ව්‍යුත්පන්න කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ.

මූලික මැනීමකින් අනතුරුව ඵලදායී පොලී ක්‍රමයක් භාවිතා කර ක්‍රමක්ෂයේ දුර්වලතා අඩු කර කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන මැනීම සිදු වේ. ආදායම් ප්‍රකාශයේ EIR ක්‍රමක්ෂය මූල්‍ය ආදායම් වල අන්තර්ගත කර ඇත. හානිපාඩු නිසා ඇතිවන අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් වල අන්තර්ගත කර ඇත.

### 4.1.7.5 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් යනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා විකිණීම සඳහා ලබා දී ඇති ලෙස නම් කර හෝ ඉහත සඳහන් කිසිදු මූල්‍ය වත්කම් වර්ගයකට අයත් නොවන ඒවා වේ. මූලික හඳුනා ගැනීමකින් පසුව, ඒවා මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් වන අතර එහි සිදුවන වෙනස්කම්, හානිපාඩු හැර වෙනත් පුළුල් ආදායම් වලින් හඳුනාගෙන සාධාරණ කොටස් සංචිතයේ සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා පවතින ණය සුරැකුම්පත් වල පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ගණනය කරන අතර ලාභ අලාභ වල හඳුනා ගැනීම සිදු වේ. ආයෝජනයක් හඳුනා නොගත් තත්ත්වයට පත්වූ විට සමකොටස් වල ආදායම හෝ වියදම ලාභ අලාභ ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබේ.

උපුටා දැක්වූ සහ උපුටා නොදැක්වූ කොටස් වල ආයෝජන වලින් විකිණීම සඳහා පවතින ආයෝජන සමන්විත වේ.

### 4.1.7.6 මූල්‍ය වත්කම් හානි කිරීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල වී ඇති බවට කිසියම් වෛෂයික සාක්ෂියක් තිබේද යන්න සමූහය අගයන අතර එය සිදු වී ඇත්නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් රැගෙන යන මුදල සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකමේ වෙනස මතය.

### 4.1.7.7 මූල්‍ය වගකීම්

**මූලික හඳුනා ගැනීම සහ මැනීම**

LKAS 39 වපසරිය තුල පවතින මූල්‍ය වගකීම් යෝග්‍ය ලෙස ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයන් සහිත මූල්‍ය වගකීම්, ණය හා ණයට ගැනීම්, ඵලදායී රැකුමක රැකුම් උපකරණයක් ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කල හැකිය. මූලික හඳුනා ගැනීමේදී සමාගම විසින් අදාළ මූලික වගකීමේ වර්ගීකරණය හඳුනා ගනියි. සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයකින් හඳුනා ගන්නා අතර ණය හෝ ණයට ගැනීම් සැලකීමේදී ක්‍රමක්ෂය පිරිවැය සලකයි. මේ සඳහා ඍජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැය අන්තර්ගත වේ.

සමාගමේ මූල්‍ය වගකීම් වලට වෙළඳාම් හා අනෙකුත් ගෙවිය යුතු දේ, බැංකු අයිරා සහ ණයට ගැනීම් අන්තර්ගත වේ.

### 4.1.7.8 ලාභ හා අලාභ හරහා සාධාරණ අගයේ පවතින මූල්‍ය වගකීම්

ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම් වලට වෙළඳ කටයුතු සඳහා පවතින මූල්‍ය වගකීම් හා ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයකින් මූලික හඳුනා ගැනීමේදීම හඳුනාගත් මූල්‍ය වගකීම් ඇතුලත් වේ. මූල්‍ය වගකීම් වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඒවා නුදුරු අනාගතයේදී විකිණීමේ අරමුණ ඇතිව ලබා ගත්තේ නම්ය. විකිණීම සඳහා තබා ඇති වගකීම් වල ලැබීම් හෝ වියදම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

මූලික හඳුනා ගැනීම තුල ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම් සමාගම විසින් හඳුනාගෙන නොමැත.

### 4.1.7.9 ණය හා ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මත පොලී දරණ ණය සහ ණයට ගැනීම් පසුව මැනීම සිදු කරයි. වගකීම් හඳුනා නොගත් විට ආදායම් ප්‍රකාශයෙන්ද ක්‍රමක්ෂය ක්‍රියාවලියේ ඵලදායී පොලී අනුපාත ක්‍රමයෙන්ද ලැබීම් හා වියදම් හඳුනා ගනියි.

අනෙකුත් වගකීම් වලට පොලී සහිත ණය සහ ණයට ගැනීම්, වෙළඳ ගෙවිය යුතු දේ, අනෙකුත් ගෙවිය යුතු දේ, ගෙවිය යුතු ආදායම් බදු සහ අදාළ පාර්ශව වලට ගෙවිය යතු දේ අන්තර්ගත වේ.

### 4.1.7.10 මූල්‍ය ඇපකර ගිවිසුම්

මූල්‍ය ඇපකර ගිවිසුම් මුලින් හඳුනාගෙන ඇත්තේ සාධාරණ වටිනාකමක් ඇති වගකීමක් ලෙස වන අතර ඇපකරය නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සඳහා සකස් කරනු ලැබේ. පසුව, වගකීම මනිනු ලබන්නේ වාර්තා කිරීමේ දිනයේදී වර්තමාන වගකීම පියවා ගැනීම සඳහා අවශ්‍ය වන වියදම් වල හොඳම ඇස්තමේන්තුවට වඩා ඉහල අගයකින් වන අතර එය හඳුනාගත් අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කිරීමෙන් ලැබේ.

### 4.1.7.11 මූල්‍ය උපකරණ හිලවු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කර ඇති ශුද්ධ මුදල සමඟ හිලවු වන්නේ පිළිගත් මුදල් පියවා ගැනීමට, ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කරගැනීමට හෝ වත්කම් එකවර පියවීමට වර්තමාන බලාත්මක කල හැකි නීතිමය ඓතියක් තිබේ නම් පමණි.

මූල්‍ය උපකරණ වල සාධාරණ අගය ලබා ගන්නේ LKAS 39 අනුවය. සමාගම විසින් මූල්‍ය වගකීමක් හඳුනා නොගන්නේ එහි ගිවිසුම්ගත බැඳීම් විසර්ජනය වීමක්, අවලංගු වීමක් හෝ කල් ඉකුත් වීමක් සිදු වූ විට පමණි.

### 4.1.7.12 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

සමාගමේ මූලික මූල්‍ය වගකීම් ණය හා ණයට ගැනීම් හා ගැනුම් හා අනෙකුත් ගෙවිය යුතු දේ වලින් සමන්විත වේ. මෙම මූල්‍ය වගකීම් වල ප්‍රධාන අරමුණ සමාගමේ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය මුදල් සැපයීම සහ එහි මෙහෙයුම් කටයුතු වලට සහය වන බවට ඇපවීම වේ. තවද සමාගම සතුව සෘජුවම එහි මෙහෙයුම් වලින් හටගන්නා ණය සහ අනෙකුත් ලැබිය යතු දේ, විකුණුම් හා අනෙකුත් ලැබිය යුතු දේ, මුදල් හා කෙටි කාලීන තැන්පතු පවතියි. ඒ අනුව සමාගම මූල්‍ය උපකරණ භාවිතා කිරීම තුලින් ණය අවදානම්, ද්‍රවශීලී අවදානම් සහ පොලී අවදානම් වලට මුහුණ දෙයි.

මෙම සටහන මඟින් ඉහත අවදානම් සඳහා සමාගම නිරාවරණය වන ආකාරය, සමාගමේ අරමුණු, අවදානම් මැනීම හා කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති ආදිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

#### ණය අවදානම්

ණය අවදානම් යනු ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක පාර්ශවකරුවෙකු ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුව හොත් සහ ගනුදෙනුකරුවන් විසින් සමූහය වෙත සහ සමාගම වෙත මූලික වශයෙන් ලැබිය යුතු මුදල් නොලැබී යාම නිසා මූල්‍ය අහිමිවීමකට ලක්වීමේ අවදානමයි.

#### වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ

සමූහය ණය අවදානම් සඳහා නිරාවරණය වීම ප්‍රධාන වශයෙන්ම ගනුදෙනුකරුවන්ගේ ස්වාධීන ගති ලක්ෂණ මත බලපායි. කෙසේ වෙතත්, කර්මාන්තයේ හා ගනුදෙනුකරුවන් ක්‍රියාත්මක වන රටේ සුපුරුදු අවදානම ඇතුළුව සමූහයේ පාරිභෝගික පදනමේ සංඛ්‍යාලේඛන කළමනාකරණය විසින් සලකා බලයි, මන්ද මෙම සාධක ණය අවදානමට බලපෑම් කල හැකි බැවිනි.

සමාගම විසින් හැකි අවස්ථාවලදී පාරිභෝගික බාහිර ශ්‍රේණිගත කිරීම් හා බැංකු යොමු කිරීම් සමාලෝචනය කරයි. එක එක ගනුදෙනුකරුවා සඳහා මිලට ගැනීම් සීමා යොදා ඇති අතර ඒවා මාස 3කට වරක් සමාලෝචනය කරයි. ණය අවදානම අධීක්ෂණය කිරීමේදී ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ණය ලක්ෂණ මත වර්ගීකරණය කරනු ලැබේ. එහිදී ඔවුන් තොග හෝ සිල්ලර ගනුදෙනුකරුවෙකුද යන්න, භූගෝලීය ස්ථානය, කර්මාන්තය, වයස, පරිණතභාවය සහ අභියෝග වලදී නොසැලෙන බව සලකා බලයි.

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු බෙදා හැරීමේ මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් මඟින් පියවා ඇති සිය මූල්‍ය වගකීම් හා බැඳී ඇති බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය නම්, පිළිගත නොහැකි හානිපාඩු සිදු නොවී හෝ සමාගමේ කීර්තිනාමයට හානි නොකර සාමාන්‍ය හා ආතති තත්ත්වයන් යටතේ නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් ඇති බව සහතික කිරීමයි.

**පොලී අනුපාත අවදානම්**

වෙළඳපොල පොලී අනුපාත වල වෙනස්වීමේ අවදානමට සමාගම නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමාගමේ දිගු කාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ. ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය හා ණය ගැනීම් වල සමතුලිත පවත්වා ගැනීම තුලින් සමාගම එහි පොලී අනුපාත අවදානම කළමනාකරණය කරයි. සමාගම කිසිදු පොලී අනුපාත මාරු කිරීමක් වෙත යොමුවී නොමැත.

## 4.1.8 භාණ්ඩ ලේඛනය

**ජීව විද්‍යාත්මක වත්කම් වල කෘෂි නිෂ්පාදන වලින් අවසන් භාණ්ඩ නිෂ්පාදනය**

යල්පැනගිය හා මන්දගාමී චලනය වන අයිතම සඳහා නිසි දීමනාවක් ලබා දීමෙන් පසු මේවායේ පිරිවැය හා ඇස්තමේන්තුගත ශුද්ධ යථාර්තවාදී වටිනාකම අඩු අගයක් ගනියි. ශුද්ධ වටිනාකම ලෙස අදහස් වන්නේ පිරිවැය සාක්ෂාත් කර ගැනීමත් අනතුරුව භාණ්ඩ විකිණිය හැකි ලෙස තක්සේරු කරන ලද විකුණුම් මිල හා/ හෝ ඒවා පවතින තත්ත්වයේ සිට විකිණිය හැකි තත්ත්වය දක්වා පරිවර්තනය කිරීමට වැය වන පිරිවැයයි.

ආදාන ද්‍රව්‍ය, අමතර කොටස් හා පරිභෝජන ද්‍රව්‍ය: බර තැබූ සාමන්‍යය මත සත්‍ය පිරිවැය

ජීව විද්‍යාත්මක වත්කම් වලින් අස්වැන්න නෙලූ කෘෂි නිෂ්පාදන: මේවා ඒවායේ සාධාරණ අගයෙන් අස්වැන්න නෙලූ ස්ථානයේ විකිණීම සඳහා වන පිරිවැය අඩු කිරීමෙන් ගණනය කරයි. සම්පූර්ණ කල හා අර්ධ වශයෙන් සම්පූර්ණ කල භාණ්ඩ ලේඛන හා කෘෂි නිෂ්පාදන ඒවායේ පරිවර්තන පිරිවැය එකතු කිරීම සිදු කර වටිනාකම දෙනු ලැබේ.

## 4.1.9 වෙළඳාම් හා අනෙකුත් ලැබිය යුතු දේ

ළඟා කර ගැනීමට ඇස්තමේන්තු ගත කර ඇති ප්‍රමාණයේ සහ අයහපත් සහ සැක සහිත ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන අගයන් අනුව වෙළඳාමෙන් ලැබිය යුතු දේ සඳහන් කර ඇත.

## 4.1.10 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල්, මූල්‍ය තැන්පතු, දන්නා මුදල් ප්‍රමාණයන් බවට පත් කල හැකි අධික ද්‍රවශීලතාවයෙන් යුතු කෙටි කාලීන ආයෝජන, සැලකිය යුතු නොවන අගය වෙනස්කම් සහිත මුදල් අර්ථදක්වා ඇත. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය සඳහා මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස පවතින අතැති මුදල් හා බැංකු තැන්පතු වලින් පවතින බැංකු අයිරා අඩු කිරීම සිදු කරයි. මාස 3න් හෝ ඊට වඩා අඩු කල් පිරීම් කාල සීමා සහිත ආයෝජනද මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලබයි.

## 4.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ අවශ්‍ය විට හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දින සිට අවුරුද්දක් ඇතුළත ගෙවිය යුතු ඒවා වේ. ජංගම නොවන වත්කම් වන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දින සිට අවුරුද්දකට වැඩි කාලයකදී ගෙවිය යුතු ඒවා වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලු දන්නා වගකීම් සලකා ඇත. අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස සමාගමට නෛතික හෝ ගිවිසුම්ගත බැඳීමක් පවතින විට ප්‍රතිපාදන හා වගකීම් හඳුනා ගන්නා අතර එම ගිවිසුම් නිරවුල් කිරීමට වැඩි ආර්ථික ලාභ අවශ්‍ය විය හැකිය.

### 4.2.1 සේවක වරප්‍රසාද

**a. අර්ථදක්වා ඇති වරප්‍රසාද සැලසුම්**

අර්ථ දක්වා ඇති වරප්‍රසාද සැලසුමක් යනු අර්ථ දක්වා ඇති දායක සැලැස්මකට වඩා සේවයෙන් පසු ලැබෙන වරප්‍රසාද සැලැස්මක් වේ. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මට අදාළ මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගෙන ඇති වගකීම යනු අතීත සිදුවීම වාර්තා කරන දිනයේදී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන වටිනාකමයි. අර්ථ දක්වා ඇති වරප්‍රසාද ගිවිසුම් වාර්ෂිකව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර ගණනය කරනු ලැබේ. අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලේ සඳහන් කර ඇති පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් වන අතර ඒ හා සම්බන්ධ වගකීම් වල නියමයන්ට ආසන්නව කල්පිරීමේ කොන්දේසි ඇත. අත්දැකීම් ගැලපීම හා ක්‍රියාකාරී උපකල්පන වල වෙනස්වීම් හේතුවෙන් පැන නගින ක්‍රියාකාරී වාසි හා අලාභ, ඒවාපැන නගින කාල පරිච්ඡේදය තුල හඳුනාගත් ආදායම් හා වියදම් ප්‍රකාශ කරමින් කොටස් වලට ඇය කරනු ලැබේ. අතීත සේවා වියදම් ඉක්මනින්ම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය මත LKAS 19 ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව සේවකයින් සඳහා ගෙවීමේ වගකීම අඛණ්ඩ 5 අවුරුදු සේවා කාලයකට පසුව මතු වේ.

වගකීමට බාහිර ප්‍රතිපාදන නොමැත. විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිපාදන හඳුනා ගැනීමේදී පහත මූලික උපකල්පන භාවිතා විය.

**මූලික උපකල්පන**

වට්ටම් ප්‍රතිශතය :10%

වැටුප් වැඩිවීමේ ප්‍රතිශතය

| | |
|---|---|
| සේවකයින් | :20% අවුරුදු දෙකකට වරක් |
| කාර්ය මණ්ඩලය | :8% වාර් ෂික |

විශ්‍රාමික වයස

| | |
|---|---|
| වතු කම්කරුවන් | :අවුරුදු 60 |
| වතු කාර්ය මණ්ඩලය | :අවුරුදු 58 |
| ප්‍රධාන ශාකා කාර්ය මණ්ඩලය | :අවුරුදු 55 |

**b. අර්ථ දක්වන ලද දායක සැලසුම් - අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

නිර්වචනය කරන ලද දායක සැලැස්ම යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර අනාගත මුදල් ගෙවීමට නීතිමය නිරමාණාත්මක හෝ බැඳීමක් නොමැත. සියළුම සේවකයින් ආවරණය වන අර්ථසාධක සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැඳීම් සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදයන්හි ලාභය හා අලාභයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

සේවකයින්ගේ දල වැටුප් අනුව 12% ක් ලංකා වැවිලිකරුවන් අර්ථසාධක සමාජය (CPPS), වතු කාර්ය මණ්ඩලය අර්ථසාධක සමිතිය (ESPS), සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සමාගම විසින් ගෙවනු ලැබේ.

සමාගමේ සියලු සේවකයින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල යටතේ සිටින අතර ඒ සඳහා සමාගම විසින් සේවකයින්ගේ ලද වැටුපෙන් 3% ක ප්‍රතිශතයක් ගෙවයි.

### 4.2.2 විලම්බිත ආදායම් - ප්‍රදාන හා සහනාධාර

රාජ්‍ය ප්‍රදානයන් හඳුනා ගනු ලබන්නේ ඒවා ලැබේ යැයි සාධාරණ සහතිකයක් පවතින විට සහ අදාළ සියලු කොන්දේසි වලට යටත් වන විටය. ප්‍රදානය වියදම් අයිතමයක් හා සම්බන්ධ වී ඇති විට, වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමින් ප්‍රදානය ගැලපීමට අවශ්‍ය කාල සීමාව තුළ එය ආදායමක් ලෙස පිළිගැනේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වී ඇති විට, එය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිතයට වඩා සමාන මුදලකට ආදායමට මුදා හරිනු ලැබේ.

සමූහයට මූල්‍යමය නොවන ප්‍රදානයන් ලැබෙන විට, වත්කම් සහ ප්‍රදාන නාමික ප්‍රමාණයන්හි දළ වශයෙන් වාර්තා වන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය හා සමාන වාර්ෂික ආයෝජන මගින් පවතින වත්කම්වල ප්‍රතිලාභ පරිභෝජනය කරන රටාව මත ආදායමට මුදා හරිනු ලැබේ. වර්තමාන අදාළ වෙළඳපල අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් සහිත රජයේ හෝ අදාළ ආයතන විසින් ණය හෝ ඒ හා සමාන ආධාර ලබා දෙන විට, මෙම වාසිදායක පොළියේ බලපෑම රජයේ අතිරේක ප්‍රදානයක් ලෙස සැලකේ.

### 4.2.3 වෙළඳාම් සහ අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳාම් සහ අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ වියදම් වල දක්වා ඇත.

## 4.3 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්

සමාගමේ ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතා වගකීම් මූල්‍ය ප්‍රකාශන වල අදාළ සටහන් යටතේ දක්වා ඇත.

## 4.4 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව සිදුවන සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම්වල ද්‍රව්‍යමයභාවය සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු වෙනස්කම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

## 4.5 කොටසක ආදායම

සමාගම් විසින් එහි සාමාන්‍ය කොටස් වල මූලික ආදායම ඉදිරිපත් කරයි. මූලික කොටසක ආදායම ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය පාර්ශවකරුවන්ගේ ලාභය හෝ අලාභය එම කාලය තුල පැවතුනු මුළු කොටස් සාමාන්‍යයෙන් බෙදීමෙනි.

## 4.6 මූල්‍ය නොවන වත්කම් හානි කිරීම

යම් වත්කමක් හානි වී ඇත්දැයි ඇඟවීමක් තිබේ දැයි බැලීමට සෑම වාර්තාකරණ දිනකදීම සමාගම විසින් ඇගයුමක් සිදු කරනු ලැබේ. එවන් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකිරීම් පරීක්ෂණයක් අවශ්‍ය නම්, සමාගම විසින් වත්කම් වල අයකර ගත හැකි මුදල් පිළිබඳව ඇස්තමේන්තු සකස් කරයි. වත්කමේ අයකර ගත හැකි මුදල, වත්කමේ හෝ මුදල් ජනනය කරන ඒකකයේ සාධාරණ අගයට වඩා ඉහල වන අතර එහි විකුණුම් පිරිවැය හා භාවිත වටිනාකමට වඩා අඩු වේ. අනෙකුත් වත්කම් හා වත්කම් සමූහයන් මත රඳා පවතින මූල්‍ය ප්‍රවාහයන් ජනනය නොවන්නේ නම් නැවත අයකර ගත හැකි මුදල ඒකක වටිනාකමක් සඳහා තීරණය කරයි. වත්කමක රැගෙන යන අගය එහි නැවත අයකර ගත හැකි අගය ඉක්මවා යන විට, එම වත්කම හානි වූ ලෙස සලකන අතර නැවත අයකර ගත හැකි මුදලක් සඳහන් කරනු ලබයි. භාවිත වටිනාකම අගයන විට වර්තමාන වෙළඳපොල ඇගයුමේ මුදල් වල කාලීන අගය හා වත්කම් වලට අනන්‍ය වූ අවදානම පිළිබිඹු වන පරිදි පූර්ව බදු වට්ටම් අනුපාතික භාවිතා කර ඒවායේ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වර්තමාන වටිනාකමට වට්ටම් ලබා දීම සිදු වේ. සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමේදී සුදුසු තක්සේරු ආකෘතියක් යොදා ගනියි. මෙම ගණනය කිරීම් තක්සේරු ගුණක, උපුටා ගත් කොටස් මිල හෝ අනෙකුත් පවතින සාධාරණ වටිනාකම් දර්ශක සමඟ සැලකීම සිදු වේ.

නැවත තක්සේරු කිරීම් සිදු කරන අවස්ථාවල දේපල නැවත තක්සේරු කරනු ලැබූ ඒවායේ හැර ගණනය කිරීමේ මෙහෙයුම් වල අලාභ පාඩු හඳුනාගෙන ඇත්තේ එම වියදම් කාණ්ඩ වල විස්තීරණ ආදායම් ප්‍රකාශය මඟින් වන අතර  එය දුර්වල වූ වත්කම් වල ක්‍රියාකාරීත්වයට අනුකූල වේ. මෙම හානි වන අවස්ථාව මුදල් නැවත තක්සේරු කල අගය තෙක් සාධාරණව හඳුනා ගනියි.

කීර්තිනාමය රහිත වත්කම් සඳහා, කලින් හඳුනා ගත් හානිය තවදුරටත් නොපවතින හෝ අඩුවී ඇත්දැයි යම්කිසි ඇඟවීමක් තිබේද යන්න එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරුවක් කරනු ලැබේ. එවන් ඇඟවීමක් ඇත්නම් සමාගම විසින් නැවත අයකරගත හැකි අගය තක්සේරු කිරීම සිදු කරයි. අවසාන හානිය හඳුනා ගන්නා තුරු වත්කම් වල අයකර ගත හැකි අගය තීරණය කිරීමේදී සිදු කරන ලද තක්සේරුකරණයන් වල යම්කිසි වෙනසක් ඇත්නම් පමණක් මුලින් හඳුනා ගත් හානිපාඩු නැවත සකස් කිරීම සිදු කරයි. එවන් අවස්ථාවක වත්කම් වල රැගෙන යන අගය, නැවත නැවත අයකර ගත හැකි අගය වැඩි කරයි. පෙර වර්ෂයේ වත්කම් සඳහා හානිය අලාභය හඳුනා ගෙන නොතිබුණි නම් වැඩි කල මුදල තීරණය කල යුතුව තිබූ රැගෙන යා හැකි ප්‍රමාණයෙන් ක්ෂයවීම් අඩු කල විට ලැබෙන අගය ඉක්මවා යා නොහැක. වත්කම් නැවත තක්සේරු කල මුදලකට ගෙන නොයන්නේ නම්, ආපසු හැරවීම නැවත ඇගයීමේ වැඩිවීමක් ලෙස සලකන්නේ නම් මිස, ආදායම් ප්‍රකාශයේ එවැනි ආපසු හැරවීම් හඳුනාගෙන ඇත. නැවත අයකර ගත හැකි අගයේ පසු කාලීන වැඩිවීම් සඳහා කීර්ති නාමය හා සම්බන්ධ හානිපාඩු නැවත ගණනය කිරීම සිදු නොකරයි.

විශේෂ වත්කම් ඇගයුමේදී පහත ක්‍රියාදාමයද යොදා ගනියි.

**කීර් තිනාමය**

සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මඟින් ගෙන යා හැකි අගය අඩපන විය හැකි බව පෙන්නුම් කරන්නේ නම්, වාර්ෂිකව හෝ වැඩි වාර ගණනක් දුර්වලතා සඳහා කීර් තිනාමය සමාලෝචනය කෙරේ. කීර් තිනාමය හානිවීම කීර් තිනාමය  අදාළ වන මුදල් ජනන ඒකකයේ (හෝ මුදල් ජනන ඒකක සමූහයක්) නැවත අයකර ගත හැකි අගය ඇගයීම තුලින් ගණනය කරයි. කීර් තිනාමය සඳහා වෙන් කර ඇති මුදල් උත්පාදන ඒකකයේ (මුදල් උත්පාදන ඒකක සමූහයේ) අයකර ගත හැකි මුදල, හානි පාඩුවකින් හඳුනා ගැනේ. කීර් තිනාමයට අදාළ හානිපාඩු අනාගත කාල වල නැවත සංශෝධනය කල නොහැක. සමාගම විසින් එහි වාර් ෂික කීර් තිනාම පරීක්ෂණය දෙසැම්බර් 31 දිනට සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, වර්තමානය වන විට සමාගමේ කීර් තිනාමය පිළිබඳ වාර්තා වී නොමැත.

**අස්පෘශ්‍ය වත්කම්**

හඳුනා ගත නොහැකි ප්‍රයෝජනවත් ජීවිත කාල සහිත අස්පෘශ්‍ය වත්කම් අදාළ පරිදි තනිතනිව හෝ මුදල් උත්පාදන ඒකක මට්ටමින් දෙසැම්බර් 31 දිනට හානිය සඳහා පරීක්ෂා කරනු ලැබේ. කෙසේ වෙතත්, වර්තමානය වන විට සමාගම සතුව වසර අවසානයේ අස්පෘශ්‍ය වත්කම් වාර්තා වී නොමැත.

## 4.7 ආදායම් ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ කාර්යසාධන අංග සාධාරණව ඉදිරිපත් කරන නිසා පිරිවැය ක්‍රමය භාවිතා කරයි.

## 4.8 ආදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ ඇති තාක් දුරට ආදායම හඳුනාගෙන ඇති අතර ඒ සඳහා වන ආදායම හා ඒ හා සම්බන්ධ වියදම් විශ්වසනීයව මැනිය හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබුනු සලකා බැලීමේ සාධාරණ වටිනාකමෙන් හෝ ලැබිය යුතු වෙළඳ වට්ටම් සහ වෙළඳ බදු වලිනි. ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

### (a) භාණ්ඩ විකිණීම

සැලකිය යුතු අවදානම් හා හිමිකම් සහතිකය මිලදීගන්නා වෙත මාරු වන විට එනම් සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දෙන විට, භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනා ගනු ලැබේ. ඉන්වොයිසියේ සඳහන් අගයෙන් කැඩුණු දෑ, විකුණුම් පිරිවැය හා අනෙකුත් ආදායම් සම්බන්ධ දෑ අඩු කිරීමෙන් ආදායම හඳුනා ගනියි.

### (b) පොළිය

එකතු කිරීමේ හැකියාව සැක සහිත විට පොලී ආදායම, උපචිත පොලිය (වත්කමේ ඵලදායී අස්වැන්න සලකා) ලෙස හඳුනා ගනියි.

### (c) ලාභාංශ

ලාභාංශ ආදායම හඳුනා ගනු ලබන්නේ ගෙවීම් ලැබීමේ අයිතිය ස්ථාපිත කල දිනයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් වන අතර උපුටාගත් සුරැකුම්පත් යනු පෙර පැවති ලාභාංශ දිනය වේ.

### (d) කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම යටතේ හඳුනාගෙන ඇත.

### (e) නිෂ්පාදන භාග

අදාළ ගිවිසුමේ කොටස අනුව ක්‍රියාකාරී පදනම මත නිෂ්පාදන භාග හඳුනා ගැනීම සිදු වේ.

### (f) අනෙකුත්

අනෙකුත් ආදායම් උපචිත පදනමින් හඳුනා ගනියි.

දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න බැහැර කිරීම සහ ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන බැහැර කිරීමේ ශුද්ධ ලාභයන් හෝ අලාභයන් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගණනය කර ඇති අතර එයින් බැහැර කිරීමෙන් ලැබෙන ආදායමෙන් අඩු කර වත්කම් රැගෙන යන ප්‍රමාණය සහ අදාළ විකුණුම් වියදම් ලෙස දක්වා ඇත. ඉවත දමන දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න වල එම වත්කමට අදාළ පවතින අගය ඍජුවම පවතින ලාභය/ (අලාභය) වෙත මාරු කිරීම සිදු කරයි.

ආනුෂංගික ක්‍රියාකාරකම්වල සිට ප්‍රධාන ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම් දක්වා ඇති වාසි සහ අලාභයන් සහ සමාගමකින් හෝ ද්‍රව්‍යමය වශයෙන් සමාන ගනුදෙනු වලින් පැන නගින ඒවා එකතු කර වාර්තා කර ශුද්ධ පදනමක් මත ඉදිරිපත් කරනු ලැබේ.

## 4.9 පිරිවැය හඳුනාගැනීම

අදාළ පිරිවැය හා ආදායමේ විශේෂ අංග අතර ඍජුව පවතින පදනම මත ආදායම් ප්‍රකාශය තුලින් වියදම් හඳුනා ගැනීම සිදු වේ. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී හා දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න නිරවද්‍යා ලෙස පවත්වා ගැනීමට දැරීමට සිදුවන සියලු වියදම් වර්ෂයේ ලාභය/ (අලාභය) තුල අය කිරීම සිදු වේ.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ වියදම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සමාගමේ ක්‍රියාකාරිත්වයේ අංගයන් තරමක් ඉදිරිපත් කරන අතර එබැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

### a) මූල්‍යකරණ ආදායම් හා වියදම්

මූල්‍ය ආදායම, ආයෝජනය කල අරමුදල් වල පොලිය හා විදේශ මුදල් පරිවර්තනය කිරීමෙන් ලැබෙන ලාභයෙන් සමන්විත වේ. පොලී ආදායම උපචිත වන නිසා ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය වියදම් ණය හා ණයට ගත දේ මත ගෙවිය යුතු පොලියෙන් සමන්විත වේ. වගකීම්වල ඉතිරි ශේෂය මත නියත වරින් වර පොලී අනුපාතයක් බිහි කිරීම සඳහා කල්බදු කාල සීමාව තුළ එක් එක් කාල සීමාව සඳහා මූල්‍ය කල්බදු ගෙවීමේ පොලී වියදම් සංරචකය වෙන් කරනු ලැබේ.

### b) ආදායම් බදු වියදම්

ආදායම් බදු වියදම් වර්තමාන බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගෙන ඇත්තේ කොටස් වශයෙන් ඍජුවම හඳුනාගෙන ඇති අයිතමයන්ට අදාළ ප්‍රමාණය හැර වේ.

**ආදායම් බදු**

වර්තමාන බදු වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායමක් සඳහා බදු ගෙවිය යුතු යැයි අපේක්ෂා කරන අතර, වාර්තා කරන දිනට පනවන ලද බදු අනුපාත සහ පෙර වර්ෂයට අදාලව ගෙවිය යුතු බදු වෙනස් කිරීම් හා දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව ගණනය කරනු ලැබේ.

### c) විලම්බිත වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභයක් හෝ සම්බන්ධතාවයක් ඇතැයි සැලකෙන වියදම් විලම්බිත වියදම් ලෙස වර්ගීකරණය කර ඇත. එවැනි වියදම් සරල රේඛීය පදනමක් මත එය සම්බන්ධ වන කාල සීමාව තුළ කපා හරිනු ලැබේ.

## 4.10 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය" භාවිතා කර සකස් කර ඇත. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ නිරූපණය කිරීමට ගෙවූ පොලිය මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ ලෙසද, ලැබුණු පොලිය හා ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙසද ගෙවූ ලාභාංශ හා ලැබුණු රාජ්‍ය දීමනා මූල්‍යමය මුදල් ප්‍රවාහ ලෙසද වර්ගීකරණය කර ඇත.

## 4.11 අංශ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාර අංශ සඳහා ආංශික තොරතුරු සපයා ඇත. සෑම ආකාරයකම නිෂ්පාදන වල අවදානම හා යහපත් ප්‍රතිඵල සැලකීමෙන් අනතුරුව සමාගම විසින් සපයන ලද භාණ්ඩ වල ස්වභාවය මත ව්‍යාපාර අංශකරණය හඳුනා ගනියි.

ඒකක අංශ එකිනෙකට ඉතා ආසන්න ලෙස පිහිටා ඇති නිසා හා එකම කර්මාන්ත පරිසරය තුල ක්‍රියාත්මක වන නිසා භූ විද්‍යාත්මක ඛණ්ඩනය මඟින් ද්‍රව්‍යමය බලපෑමක් සිදු නොවේ.

අංශ වල ක්‍රියාකාරකම් පිටු 29 හි මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වල විස්තර කර ඇත.

ඒ ඒ කොටස් වලට සෘජුවම අදාළ වන ආදායම් හා වියදම් අදාළ අංශ වලට පවරා ඇත. යන කොටසක් සඳහා සෘජුවම අදාළ නොවන ආදායම් හා වියදම් අදාළ පරිදි සම්පත් භාවිතය පදනම් කරගෙන පවරා ඇත.

ඒ ඒ කොටස් වෙත සෘජුවම ආරෝපණය කල හැකි වත්කම් හා වගකීම් අදාළ අංශ වලට පවරා ඇත. කොටසකට සෘජුවම ආරෝපණය කල නොහැකි වත්කම් හා වගකීම් හැකි අවස්ථාවල සාධාරණ පදනමින් පවරා ඇත. නොපැවරූ දේ ප්‍රධාන වශයෙන්ම පොලී සහිත ණය, ණයට ගැනීම් හා වියදම් වලින් සමන්විත වේ.

අංශ ප්‍රාග්ධන වියදම් යනු ගිණුම්කරණ කාල පරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන අත්පත් කරගත් අංශ වත්කම් වල මුළු පිරිවැයයි.

**<u>සටහන 01 - කල්බදු දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න</u>**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| භාවිත අයිතිය ඇති ඉඩම් | 01:01 | 54,953,417 | 56,906,297 |
| දරන්නාගේ නිශ්චල ජීව විද්‍යාත්මක බදු වත්කම් | 01:02 | 92,906,472 | 94,008,012 |
| ස්ථාවර බදු වත්කම් (භාවිත කල හැකි ඉඩම් හා දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් හැර) | 01:03 | 1,352,472 | 2,597,588 |
| **එකතුව** | | **149,212,360** | **153,511,897** |

**<u>සටහන 01:01 - භාවිත අයිතිය ඇති ඉඩම්</u>**

බදු මත භාවිත අයිතිය ඇති ඉඩම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් 2013 අගෝස්තු 21 දින නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශය (SoAT) හා නිර්දේශිත පුහුණු ප්‍රකාශයේ (SoRP) සංශෝධන අනුව ගණනය කර ඇත.

භාවිත අයිතිය සහිත ඉඩම ඉතිරි බදු කාලය තුල හෝ ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාලය තුල වඩාත් කෙටි කාලය තුල ක්‍රමක්ෂය වීම සිදු වන අතර එය ජංගම නොවන වත්කම් යටතේ සඳහන් වේ. භාවිත අයිතීන් සහිත ඉඩම් සඳහා නිර්දේශිත පුහුණු ප්‍රකාශය තුල නැවත අගය නියම කිරීමට අවසර දෙනු නොලැබේ. එම අගය 1993 ජූලි 23 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වෙත රැගෙන විත් ඇති අතර 2014 දෙසැම්බර් 31 තෙක් භාවිත අයිතිය සහිත ඉඩමේ ක්‍රමක්ෂය පහත පරිදි වේ.

| | **පිරිවැය/ නැවත මිල කල අගය** | | | |
|---|---|---|---|---|
| | **2018.01.01 දිනට** | **වර්ෂය සඳහා එකතු කිරීම්** | **(බැහැර කිරීම් සහ අල්ලා ගැනීම්)** | **2018.12.31 දිනට** |
| | රු. | රු. | රු. | රු. |
| භාවිත අයිතිය සහිත ඉඩම් | 104,262,376 | - | - | 104,262,376 |

| | **ක්‍රමක්ෂය** | | | |
|---|---|---|---|---|
| | **2018.01.01 දිනට** | **වර්ෂය සඳහා අය කිරීම්** | **බැහැර කිරීම් සහ අල්ලා ගැනීම් මත** | **2018.12.31 දිනට** |
| | රු. | රු. | රු. | රු. |
| රැගෙන යන අගය | 47,356,079 | 1,952,880 | - | 49,308,959 |
| | **56,906,297** | | | **54,953,417** |

## ආරම්භයේ සිට බැහැර කිරීම් හා අත්පත් කර ගැනීම්

| | පිරිවැය/ නැවත අගය කල ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | වත්කමේ ජීවිත කාලය | 1993.07.23 දිනට රු. | බැහැර කිරීම් හා අත්පත් කර ගැනීම් | 2018.12.31 දිනට රු. |
| භාවිත අයිතිය ඇති ඉඩම් | අවුරුදු 53 | 113,710,417 | (9,448,041) | 104,262,376 |

| දිනය | ස්ථානය | ගනුදෙනු පක්ෂය | පිරිවැය/ නැවත අගය කල ප්‍රමාණය | භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර්) | ගනුදෙනුවේ ස්වභාවය | වැදගත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **මූල්‍ය ප්‍රකාශන තුල සකස් කර ඇත** | | | | | | |
| 13.11.1996 | කබරගල හා පොනේගල කොට්ටාස | JEDB | (6,641,731) | 217 | ගිවිසගත් පරිදි සමාගම වෙත භාර දී නොමැත | |
| 23.07.1997 | නාලන්ද වතුයාය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | (873,854) | 39,502 | භාරදී ඇත | |
| 07.10.1998 | නාලන්ද වතුයාය | | (248,064) | 9,912 | කර්මාන්තපුරයක් වෙත නිදහස් කරයි. | 2001.02.26 දින වන්දි ලෙස රු. 6,750,000 ක් ලැබුණි. |
| | වතු | | (94,239) | | භූමිය නිදහස් කිරීම | |
| 2002 | හපුගස්තැන්න වතුයාය | | (852,163) | | භූමිය නිදහස් කිරීම | |
| 2008 | රත්වත්තේ වතුයාය | | (111,520) | | භූමිය නිදහස් කිරීම | |
| 2014 | නාලන්ද වතුයාය | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | (626,470) | 28,318 | භූමිය නිදහස් කිරීම | නාලන්ද වතුයායේ ලොට් අංක A (හෙක් 5.1095) හා B (හෙක් 23.2085) 2013.04.18 දිනැති අංක 1806/5 දරණ ගැසට් පත්‍රය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් අත්පත් කර ගන්නා ලදී. |
| | | | (9,448,041) | | | |
| **මූල්‍ය ප්‍රකාශන තුල සකස් කර නොමැත** | | | | | | |
| 07.06.1995 | උකුවෙල කාර්යාලය | ශ්‍රී ලංකා යුධ හමුදාව | - | 1.8 | ගජබා රෙජිමේන්තුව වෙත නිදහස් කිරීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1996.07.25 දින නිදහස් කිරීම අනුමත කරන ලදී. |
| 23.02.2000 | නාලන්ද වතුයාය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | - | 4.26 | භූමිය නිදහස් කිරීම | 2000.02.23 දිනැති අංක 1120/9 දරණ ගැසට් නිවේදනය හා සමගාමීව |
| 03.03.1995 | හපුගස්පිටිය වතුයාය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | 3.38 | භූමිය නිදහස් කිරීම | වන්දි මුදලක් නොලැබුණි |
| 2001 | නෙල්ල ඔල්ල වතුයාය | ඇග්‍රිස්කොඩ් සමාගම | - | 125.0014 | | පන්සල්තැන්න තේ කර්මාන්තශාලාව කුඩා තේ වතු සීමාසහිත සමාගමේ තේ ශක්ති ව්‍යාපෘතිය සඳහා බදු දෙන ලදී |
| 2003 | පන්සල්තැන්න වතුයාය | ඊ ඕ ඒ එස් ඕගනික්ස් පුද්ගලික සමාගම | - | | තේ කර්මාන්තශාලාව බදු දීම | පන්සලතැන්න තේ කර්මාන්තශාලාව 2013 සිට ඊ ඕ ඒ එස් ඔර්ගනික්ස් පුද්ගලික සමාගමට බදු දෙන ලදී |
| 25.11.2010 | නාලන්ද වතුයාය | පල්ලේපොල දිස්ත්‍රික් ලේකම් | - | 4.2483 | නිදහස් කිරීම | රු. 4,700,000 ක වන්දි මුදලක් අනුමත කරන ලද අතර එය ගිණුම්ගත වී නොමැත |
| | | | - | | | |
| | | | (9,448,041) | | | |

**සටහන 01:01 - පොදු කටයුතු සඳහා භූමිය නිදහස් කිරීම**

මෙම පුළුල් කිරීම සඳහා නාලන්ද වතුයායෙන් ආසන්න වශයෙන් හෙක්ටෙයාර් 26ක් නිදහස් කරන ලදී. සමාගම විසින් නිදහස් කරන ලද ඉඩමේ වටිනාකම තක්සේරුකිරීමක් සිදු නොකරන ලද අතර එම නිසා ගිණුම් වල සංශෝධනයක් සිදු නොකරන ලදී.

මධ්‍යම පළාත් සභාව සඳහා බණ්ඩාරපොළ වතුයායෙන් ආසන්න වශයෙන් හෙක්ටෙයාර් 1 ක් නිදහස් කරන ලදී. සමාගම විසින් නිදහස් කරන ලද ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමක් සිදු නකරන ලද අතර එම නිසා ගිණුම්වල සන්ශෝධනයක් සිදු නොකරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ අනුමැතියකින් තොරව ඉහත වතුයායෙන් ආසන්න වශයෙන් හෙක්ටෙයාර් 17.22 ක ප්‍රමාණයක් නගර සංවර්ධනය, තේ වගා සංවර්ධනය සහ දෙහිදෙනිය රජයේ පාසල සංවර්ධනය යන කටයුතු සඳහා නිදහස් කරන ලදී. සමාගම විසින් නිදහස් කරන ලද ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමක් සිදු නොකරන ලද අතර එම නිසා ගිණුම්වල සංශෝධනයන් සිදු නොකරන ලදී.

ඉහත විස්තර කර ඇති නිදහස් කල ඉඩම් සඳහා ඇල්කඩුව වැවිලි සමාගම වෙත කිසිදු වන්දියක් හිමි නොවුනි.

**සටහන 01:02 - දරන්නාගේ නිශ්චල කල්බදු ජීව විද්‍යාත්මක වත්කම්**

UITF හි තීන්දුව අනුව මේ දක්වා සියලුම SLSPC වතු කල්බදු ක්‍රියාත්මක කර නොමැති නමුත් මූල්‍ය කල්බදු යටතේ මෙම වතුවල ඇති සියලුම නිශ්චල වත්කම් 1993 ජුලි 23 දින නැවත ක්‍රියාත්මක වන පරිදි සමාගමේ පොත් වලට ගෙන ඇත. මෙම කාර්යය සඳහා, 1995 මාර්තු 8 වන දින රැස්වීමේදී මණ්ඩලය තීරණය කලේ මෙම වත්කම් SLSPC හි පොත්වල අන්තර්ගත පරිදි වත්කම් පොත්වල ගෙන යා යුතුය. මෙය සමාගම පිහිටුවන දිනට පෙර සිදුකල යුතුය. මෙම වත්කම් 1993 ජුලි 23 පොත් වලට ඇතුලත් කර ඇති අතර ලියූ අගයන් පහත පරිදි වේ.

**දරන්නාගේ නිශ්වල කල්බදු ජීව විද්‍යාත්මක වත්කම්**

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | **2018** | **2017** |
| | රු. | රු. |
| 2013 ජුලි 23 දිනට ප්‍රාග්ධනීකරණය කල අගය | 33,080,567 | 33,080,567 |
| ජනවාරි 1 දිනට පිරිවැය | 33,080,567 | 33,080,567 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 1 දිනට | 26,812,940 | 25,711,411 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 1,101,539 | 1,101,527 |
| දෙසැම්බර් 31 දිනට | 27,914,478 | 26,812,938 |
| දෙසැම්බර් 31 දිනට රැගෙන යන අගය | 5,166,089 | 6,267,629 |
| නොමේරූ වතු | 87,740,383 | 87,740,383 |
| **මුළු රැගෙන යන අගය** | **92,906,472** | **94,008,012** |

වතු කල්බදු ලෙස සමාගම වෙත ලබා දෙන අවස්ථාවේ නොමේරූ ලෙස වර්ගීකරණය කර ඇති වතු වත්කම් වල ආයෝජනය නොමේරූ වතු යටතේ දක්වා ඇත (1993.07.23 දින නැවත වටිනාකම බලා ඇත). තවද ඒවා නොමේරූ වතු දරන්නා වෙත ගෙන ඒමට තවදුරටත් කරන ලද ආයෝජන දක්වා ඇත. මෙම වගාවන් එවන් තත්වයක් කරා රැගෙන ඒම සඳහා සිදු කරන ලද අමතර ආයෝජන නොමේරූ වතු සිට පරිනත වගාවන් දක්වා මාරු කිරීමක් සිදු කරන ලදී.

කෙසේ වෙතත්, එතැන් පටන් JEDB/SLSPC වෙත ආරෝපණය කල හැකි නොමේරූ වතු වල ආයෝජනයන් මේරූ වතු වලට මාරු කරන ලදී. මෙම මේරූ තේ හා රබර් LKAS 41 - කෘෂිකාර්මික අනුව දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. SLSPC/JEDB මඟින් බදු දෙන ලද දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් වල රැගෙන යන අගය පිරිවැයෙන් ක්‍රමක්ෂය අඩු කිරීමෙන් ලබා ගනියි. එවැනි වතු මේරූ තත්ත්වයට රැගෙන ඒමට දරණ අනාගත ආයෝජන සටහන 3 හි දක්වා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ මාර් ග ඉදිකිරීමට 1999 වර්ෂයේදී නාලන්ද වතුයායෙන් ඉවත් කල ශාක සඳහා රු. 1,887,100 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් වන්දියක් ලෙස සමාගමට ලැබුණි. මෙය 1999 වසරේ ආදායම් ප්‍රකාශයෙන් ආදායමක් ලෙස හඳුනා ගෙන ඇත. සමාගම විසින් මේරූ හා නොමේරූ මෙම ශාක වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැත. රබර් ශාක ඉවත් කරන විට ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසන් වී තිබුණි.

**සටහන 01:03 - කල්බදු වත්කම් (භාවිත අයිතිය සහිත ඉඩම් හා දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් හැර)**

| | | | | **2018** | **2017** |
|---|---|---|---|---|---|
| | ඉඩම සඳහා සංවර්ධනයන් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍රෝපකරණ හා ආම්පන්න රු. | එකතුව රු. | එකතුව රු. |
| 1993 ජූලි 23 ප්‍රාග්ධනීකරණ වටිනාකම | 736,725 | 32,271,545 | 9,079,004 | 42,087,274 | 42,087,274 |
| ජනවාරි 1 දිනට පිරිවැය | 736,725 | 32,271,545 | 9,079,004 | 42,087,274 | 42,087,274 |
| සමුච්චිත ක්‍රමක්ෂය | | | | | |
| ජනවාරි 1 දිනට | 599,012 | 29,811,680 | 9,078,995 | 39,489,686 | 38,244,568 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 24,533 | 1,220,583 | - | 1,245,116 | 1,245,118 |
| | 623,544 | 31,032,263 | 9,078,995 | 40,734,802 | 39,489,686 |
| **දෙසැම්බර් 31 වන විට රැගෙන යන අගය** | **113,181** | **1,239,282** | **9** | **1,352,472** | **2,597,588** |

**ක්‍රමක්ෂය අනුපාතයන්**

| | |
|---|---|
| මේරු වතු/ ඉඩම් සංවර්ධනය | අවුරුදු 30 |
| ගොඩනැගිලි | අවුරුදු 25 |
| යන්ත්‍රෝපකරණ | අවුරුදු 15 |

සටහන 02 - සින්නක්කර දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න

| | 2018.01.01 දිනට ශේෂය | ගැලපීම් | වර්ෂය තුල එකතු කිරීම් / (ඉවත් කිරීම්) | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| **පිරිවැය** | | | | |
| වතු මාර්ග | 14,789,262 | - | - | 14,789,262 |
| ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය | 37,709,794 | (2,125,614) | 378,815 | 35,962,995 |
| මෝටර් වාහන | 22,493,057 | - | 1,000,633 | 23,493,690 |
| ගෘහභාණ්ඩ හා සවිකෘත | 2,240,765 | - | 13,118 | 2,253,882 |
| ආම්පන්න | 9,551,072 | - | 407,700 | 9,958,772 |
| ජල සනීපාරක්ෂාව හා විදුලි සැපයුම | 3,401,371 | - | - | 3,401,371 |
| යන්ත්‍රෝපකරණ | 4,165,938 | - | - | 4,165,938 |
| කිරි ගොවිපළ - මිල්ලවාන | 2,125,614 | - | - | 2,125,614 |
| | 96,476,872 | (2,125,614) | 1,800,266 | 96,151,524 |

| **ක්ෂයවීම්** | 2018.01.01 දිනට ශේෂය | ගැලපීම් | වර්ෂය තුල එකතු කිරීම් / (ඉවත් කිරීම්) | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| වතු මාර්ග | 3,283,101 | | 409,892 | 3,692,993 |
| ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය | 7,823,610 | (457,618) | 858,395 | 8,224,387 |
| මෝටර් වාහන | 22,437,416 | | 76,628 | 22,514,043 |
| ගෘහභාණ්ඩ හා සවිකෘත | 1,681,995 | (104,926) | 115,104 | 1,692,173 |
| ආම්පන්න | 6,575,260 | (70,794) | 520,069 | 7,024,535 |
| ජල සනීපාරක්ෂාව හා විදුලි සැපයුම | 2,502,182 | | 118,428 | 2,620,610 |
| යන්ත්‍රෝපකරණ | 4,082,225 | | 24,300 | 4,106,525 |
| කිරි ගොවිපළ - මිල්ලවාන | 410,198 | | 53,140 | 463,338 |
| | 48,795,986 | (633,338) | 2,175,956 | 50,338,604 |
| **ශුද්ධ පොත් වටිනාකම** | **47,680,886** | | | **45,812,920** |
| කල් බදු පදනම මත අතිපත් කරගත් වත්කම්/ මෝටර් වාහන | | | | |
| පිරිවැය | - | - | 1,685,667 | 1,685,667 |
| ක්ෂය වීම් | - | - | | - |
| ශුද්ධ පොත් අගය | - | - | - | |

| | 2018.01.01 දිනට ශේෂය | ගැලපීම් | වර්ෂය තුල එකතු කිරීම් / (ඉවත් කිරීම්) | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 3,980,430 | - | 1,151,094 | 5,131,574 |
| **මුළු ශුද්ධ පොත් වටිනාකම** | **51,661,313** | | | **52,630,161** |

ඉහත සඳහන් වත්කම්, සමාගම ආරම්භක දින (1993.07.23) අදාළ ගැසට් නිවේදනය මඟින් සමාගම වෙත භාර දී ඇති වත්කම් වන අතර සියලු අපෘශ්‍ය වත්කම් සමාගම ආරම්භක දින සිට පවතින ආයෝජන වේ.

තවද, නිශ්චල JEDB/SLSPC හි මූල්‍ය බදු ලෙස පවතින වතු වත්කම් (කල්බදු දේපල හැර) හා 1993 ජූලි 23 ලබාගත් නොමේරු/ මේරු වතු හැර සපෘශ්‍ය වත්කම් වල වටිනාකම තක්සේරු කිරීම එම දිනයේදී ශුද්ධ පොත් අගය මත රඳා පවතියි. මෙම වටිනාකම් ස්වාධීන වත්කම් ලෙස නොතිබුණි.

**සටහන 03 - ධාරක ජීව විද්‍යාත්මක වත්කම්**

| | නොමේරු වගාවන් | | | | මේරු වගාවන් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | තේ | රබර් | පොල් | අනෙකුත් | තේ | රබර් | පොල් | අනෙකුත් | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | |
| 2018.01.01 දිනට | 67,569,740 | 94,067,943 | 114,448,423 | 94,169,141 | 14,841,529 | 10,253,445 | 14,178,682 | 14,676,699 | 424,205,602 |
| එකතු කිරීම් | - | 8,261,707 | 7,924,230 | 2,232,784 | 1,395,621 | 39,459,929 | 57,031,931 | 23,546,930 | 139,853,133 |
| මේරු වගාවන් වලට මාරු කිරීම් | (1,395,621) | (39,459,929) | (57,031,931) | (23,546,930) | - | - | - | - | (121,434,411) |
| 2018.12.31 දිනට | **66,174,119** | **62,869,721** | **65,340,722** | **72,854,995** | **16,237,150** | **49,713,374** | **71,210,613** | **38,223,629** | **442,624,323** |
| **ක්ෂයවීම්** | | | | | | | | | |
| 2018.01.01 දිනට | - | - | - | - | 5,809,066 | 6,962,800 | 6,384,004 | 3,588,121 | 22,743,991 |
| වර්ෂය සඳහා අයවීම් | - | - | - | - | 489,770 | 512,672 | 283,574 | 348,283 | 1,634,299 |
| 2018.12.31 දිනට | **-** | **-** | **-** | **-** | **6,298,836** | **7,475,472** | **6,667,578** | **3,936,404** | **24,378,290** |
| **2018.12.31 දිනට පොත් අගය** | **66,174,119** | **62,869,721** | **65,340,722** | **72,854,995** | **9,938,314** | **42,237,902** | **64,543,035** | **34,287,225** | **418,246,033** |
| **2017.12.31 දිනට පොත් අගය** | **67,569,740** | **94,067,943** | **114,448,423** | **94,169,141** | **9,032,463** | **3,290,645** | **7,794,678** | **11,088,578** | **401,461,611** |

මේවා සමාගම පිහිටුවීමේ සිට පවතින ආයෝජන වේ. වතු කල්බදු ලෙස ලබා ගෙන ඇති වත්කම් (වතු වත්කම් ඇතුළුව) සටහන් 1 හි දක්වා ඇත. බදු ලෙස ලබාගෙන ඇති නොමේරු වතු මත ආයෝජන ඉහත සටහනේ දක්වා ඇත. එවන් වතු දරන්නා වෙත පැමිණෙන විට මෙම සටහන යටතේ ඒවා නොමේරු සිට මේරු වතු දක්වා පරිවර්තනය කිරීමට වැයවන අමතර ආයෝජන දක්වා ඇත.

LKAS 41 යටතේ දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ අගයෙන් පිරිවැය අඩුකළ විට ලැබෙන අගය හඳුනා ගැනීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් 2012 මාර්තු 2 වන දින නිකුත් කර ඇති නීති මඟින් ඉක්මවා ඇත. ඒ අනුව දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් පිරිවැය මැනීමට LKAS 16 (දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න) යොදා ගැනීමට සමාගම තෝරා ගන්නා ලදී.

අවුරුද්ද තුල ණයට ගැනීමේ පිරිවැයක් ප්‍රාග්ධනීකරණය කර නොමැත

| සටහන 04 - පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| ජනවාරි 1 වන විට | 311,900,488 | 278,565,316 |
| සංවර්ධනය නිසා සාධාරණ අගයේ වෙනස්කම් නිසා ඇතිවන ලාභය/(අලාභය) න් විකුණුම් පිරිවැය අඩු කල විට අගය වැඩිවීම | 4,163,655 | 41,466,563 |
| අස්වැන්න නිසා අඩුවීම | (10,992,755) | (8,131,391) |
| **දෙසැම්බර් 31 වන විට** | **305,071,397** | **311,900,488** |

කළමනාකරණය කල ශාක වතුයාය තුල වාණිජ දැව වගාව තුල දක්වා ඇත. සුළු ජෛව විද්‍යාත්මක පරිවර්තනයක් සිදු වී ඇති නොමේරූ ශාක වල පිරිවැය දළ වශයෙන් සාධාරණ වටිනාකමක් ලෙස සලකනු ලබන අතර ජෛව විද්‍යාත්මක පරිවර්තන මිලෙහි බලපෑම ද්‍රව්‍යමය නොවේ. එවැනි වගාවන් මේරූ තත්ත්වයට පත්වන විට, ඒවා මේරූ තත්ත්වයට ගෙන ඒමට දරනු ලැබූ අමතර ආයෝජන නොමේරූ සිට මේරූ දක්වා මාරු කරනු ලැබේ.

LKAS 41 අදාළ වන්නේ කළමනාකරණ කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් වන බැවින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ලද තීන්දුව අනුව කළමනාකරණය කල ශාක වල සාධාරණ වටිනාකම සොයා ගන්නා ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ මිල ලැයිස්තුව මත පදනම්ව 2015 ජූනි මාසයේදී විස්තරාත්මක සංගණනයක් සිදු කරන ලද අතර 2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 277,884,695 ක් ලෙස ගණනය කරන ලදී. සංගණනය සඳහා යොදා ගන්නා ලද ශාක වලින් සැලකිය යුතු ප්‍රමාණයක් 2013 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුකරණය සඳහා යොදා ගෙන නොමැති අතර එම නිසා සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් හේතුවෙන් ඇති වූ ලාභය 2013 ජනවාරි 1 වන දින වන විට ආරම්භක රඳවා ගත් ඉපැයීම් සහ පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම් නැවත ලබා දීමෙන් නැවත සලකා බැලීය. 2013 ජනවාරි 1 දිනට ගණනය කල යුතුව තිබූ ශාක වල සාධාරණ අගය වර්ෂය තුල සිදු වූ ජෛව විද්‍යාත්මක පරිවර්තනය ලෙස ශාකයකට රු. 3,898 ක මුදලක් ආදේශනය කිරීම මඟින් ලබා ගන්නා ලදී. මෙම ආදේශිත අගය 2013 හා 2014 වර්ෂ වල ශාක 3244ක් සඳහා වන සාධාරණ අගය මඟින් ලබා ගන්නා ලදී. ඒ අනුව සාධාරණ අගයේ වෙනස් කම් නිසා ලද ලාභය 2013 හා 2014 වර්ෂ වල පිළිවෙලින් රු. 97,083,003 හා රු. 84,630,003 වේ. එම අගයන් දෙකෙහි වෙනස වන රු. 56,618,067 2013 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයීම් නැවත සඳහන් කිරීම ලෙස ගණනය කරන ලදී.

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| | <u>රැගෙන යන අගය</u> <u>රු.</u> | <u>සාධාරණ අගය</u> <u>රු.</u> | <u>රැගෙන යන අගය</u> <u>රු.</u> | <u>සාධාරණ අගය</u> <u>රු.</u> |
| <u>සටහන 5 - මූල්‍ය ආයෝජන</u> | | | | |
| ස්ථාවර තැන්පතු - කල් පිරීම සඳහා තබා ඇති | 72,722,250 | 75,361,958 | 42,722,250 | 45,361,958 |

| <u>සටහන 6 - තොග</u> | **2018** රු. | **2017** රු. |
|---|---|---|
| යෙදවුම් ද්‍රව්‍ය | - | - |
| වැඩෙන භෝග තවාන් | 1,501,745 | 2,209,640 |
| නිෂ්පාදන තොගය | 3,808,720 | 4,725,712 |
| අමතර කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය | 8,192 | 225,890 |
| | **5,318,658** | **7,161,242** |

| <u>සටහන 7 - වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ</u> | | |
|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ | 103,996,661 | 83,779,409 |
| අත්තිකාරම් හා මුලින් ගෙවීම් | 21,327,189 | 19,499,826 |
| ආර්ථික සේවා ගාස්තු | 752,820 | 752,820 |
| රඳවා ගැනීමේ බදු | 1,680,225 | 1,963,949 |
| | **127,756,894** | **105,996,004** |

සටහන 8 - මුදල් හා මුදල් වලට සමාන දෑ

| | | |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් - | | |
| ප්‍රධාන කාර්යාලය | 47,975,111 | 52,686,916 |
| වතුයායේ මුදල් | 1,080,945 | 994,931 |
| අතැති මුදල් හා මුද්දර | 323,38 | 451,032 |
| | **49,379,440** | **54,132,879** |

සටහන 09 - ප්‍රකාශිත ප්‍රාග්ධනය

| | | **2018** | **2017** |
|---|---|---|---|
| **නිකුත් කල හා මුළුමනින්ම ගෙවූ කොටස්** | | | |
| සාමාන්‍ය කොටස් හා භාණ්ඩාගාර යටතේ ඇති විශේෂ අයිතීන් සහිත රන් කොටස් | ගණන | 18,000,001 | 18,000,001 |
| **නිකුත් කල හා මුළුමනින්ම ගෙවූ කොටස් වල වටිනාකම** | | | |
| සාමාන්‍ය කොටස් හා භාණ්ඩාගාර යටතේ ඇති විශේෂ අයිතීන් සහිත රන් කොටස් | රු. | 180,000,010 | 180,000,010 |

සාමාන්‍ය කොටස් හිමියන්ට කලින් කලට ලාභාංශ ලබා ගැනීමට අයිතිය පවතින අතර අතර කොටසකට එක් ඡන්දයක් දියහැක.

සටහන 10 - බදු ගිවිසුම් යටතේ ඇති බැඳීම්

| | **2018** | | | **2017** |
|---|---|---|---|---|
| | ජංගම පරිනතභාවයේ ශුද්ධ අගය | ජංගම පරිණතභාවය | එකතුව | |
| | රු. | රු. | රු. | රු. |
| **ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව** | | | | |
| මුළු වගකීම | 217,500 | 5,000 | 222,500 | 222,500 |
| අඩු කිරීම්: මූල්‍ය අයකිරීම් | 180,075 | 3,643 | 183,718 | 183,718 |
| **ශුද්ධ වගකීම්** | **37,425** | **1,357** | **38,782** | **38,782** |
| **ලංකා බැංකුව** | | | | |
| මුළු වගකීම | 755,271 | 697,254 | 1,452,525 | - |
| අඩු කිරීම්: මූල්‍ය අයකිරීම් | 60,379 | 145,996 | 206,375 | - |
| **ශුද්ධ වගකීම්** | **694,892** | **551,258** | **1,246,150** | **-** |
| | **732,317** | **552,615** | **1,284,932** | **38,782** |

සටහන 11 - විලම්බීත ආදායම

| | | |
|---|---|---|
| ප්‍රදානයන් සහ සහනාධාර | | |
| වසර මුල පවතින | 27,261,212 | 28,178,190 |
| එකතු කිරීම්: වර්ෂය සඳහා ලැබුණු ප්‍රදානයන් | - | - |
| | 27,261,212 | 28,178,190 |
| අඩු කිරීම්: වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 916,978 | 916,978 |
| | 26,344,234 | 27,261,212 |

ලයින් කාමර වල වහල නැවත සවි කිරීම, වැසිකිලි, ජල සැපයුම හා සනීපාරක්ෂාව ආදී සේවක පහසුකම් සඳහා වතු මානව සංවර්ධන භාරයෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සමාගම වෙත ප්‍රදානයන් ලැබී ඇත. වියදම් කල ප්‍රමාණයන් දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල අදාළ වර්ගීකරණයේ ඇතුලත් කර ඇත. දේපල, යන්ත්‍රෝපකරණ හා ප්‍රදානයන් විලම්බීත ප්‍රදානයන් හා සහනාධාර යටතේ දක්වා ඇත

**සටහන 12 - විශ්‍රාමික වරප්‍රසාද පාරිතෝෂිකය**

| | දෙසැම්බර් වන විට | |
|---|---|---|
| | **2018** | **2017** |
| | රු. | රු. |
| ආරම්භක බැදියාව වර්තමාන අගයට | 159,052,619 | 149,691,847 |
| පොළී පිරිවැය | 17,640,742 | 14,969,185 |
| ප්‍රවර්තන වර්ෂයේ පිරිවැය | 11,011,240 | 8,736,089 |
| **අඩු කිරීම්** | | |
| පාරිතෝෂික ගෙවීම් | (12,011,039) | (2,790,826) |
| ගෙවිය යුතු පාරිතෝෂික | - | (15,365,356) |
| ආයු ගණන(ලාභ)/අලාභ | 2,433,570 | 3,811,680 |
| | 178,127,132 | 159,052,619 |

| | | |
|---|---|---|
| සටහන | | |
| | 103,363,136 | 103,300,180 |
| විශ්‍රාමික සේවකයින් වෙත නොගෙවූ පාරිතෝෂිකය | 178,127,132 | 159,052,619 |
| විශ්‍රාමික වරප්‍රසාද බැදීම් | **281,490,268** | **262,352,799** |

ඇක්චුරියල් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම විසින් ආයු ගණන ක්‍රමය ඔස්සේ ව්‍යපෘති ඇගයීමේ පදනම භාවිතයෙන් 2018 දෙසැම්බර් 31 දිනට වගකීම ගණනය කොට ඇත.

භාවිතා කර ඇති මූලික ක්‍රියාකාරී උපකල්පනය

a. වට්ටම් ප්‍රතිශතය — 12%

b. වැටුප් වර්ධනය

- කාර්ය මණ්ඩලය — වාර්ෂිකව 8%
- සේවකයින් — වසර දෙකකට වරක් 20%

වගකීම සඳහා බාහිර අරමුදල් ලැබී නොමැත

**සටහන 13 - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ**

| | | | |
|---|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ | | 76,104,124 | 78,907,149 |
| තැරැව්කරුවන්/අනෙකුත් ලැබුණු අත්තිකාරම් | | 12,300,103 | 2,687,758 |
| ලාභාංශ හා ණය මත පොලිය | | 55,359,546 | 40,079,546 |
| වැටුප් වගකීම් | සටහන 13:01 | 139,958,962 | 180,770,424 |
| | | 283,722,735 | 302,444,877 |

## 13.1 වැටුප් වගකීම්

| | | |
|---|---|---|
| EPF/ETF/ESPS සහ CPPS | 167,213,962 | 189,389,623 |
| EPF/ETF සහ පාරිතෝෂික දඩ | 88,374,460 | 95,293,151 |
| පෙර වර්ෂය | 255,588,422 | 284,682,774 |
| අඩු කිරීම්: උසාවි හරහා ගෙවීම් | 115,629,460 | 103,912,350 |
| | 139,958,962 | 180,770,424 |

**14. සම්බන්ධිත පාර්ශව වත ගෙවිය යුතු මුදල්**

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 1,768,749 | 1,768,749 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 1,185,670 | 1,185,670 |
| අන්තර් වතු ගිණුම් | (27,313,420) | (14,691,639) |
| | (24,359,001) | (11,737,219) |

**සටහන 15 - නිදහස් කල හැකි ණයකර**

| ණයකර හිමිකරු | නිකුත් කල දිනය | කල්පිරෙන දිනය | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 1995.06.16 | 2000.06.15 | 5,000,000 | 5,000,000 |
| අවුරුද්දක් තුල ගෙවිය යුතු | | | 5,000,000 | 5,000,000 |

2000 ජුනි 15 දින කල් පිරීමෙන් අනතුරුව පොලිය ඇය කරනු නොලැබේ.

**සටහන 16 - කෙටි කාලීන ණයට ගැනීම්**

| | | |
|---|---|---|
| තාවකාලික ණය | | |
| ලංකා බැංකුව | 2,750,674 | - |
| හලාවත වැවිලි සමාගම | 20,000,000 | 22,750,674 |
| බැංකු අයිරා | 60,754,534 | 44,427,786 |
| | 83,505,208 | 67,178,460 |

සටහන **17-** ආදායම

| | තේ (කොළ) | | රබර් | | පොල් | | කොකෝවා | | අනෙකුත් භෝග | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2018**<br>රු. | **2017**<br>රු. | **2018**<br>රු. | **2017**<br>රු. | **2018**<br>රු. | **2017**<br>රු. | **2018**<br>රු. | **2017**<br>රු. | **2018**<br>රු. | **2017**<br>රු. | **2018**<br>රු. | **2017**<br>රු. |
| ආදායම | 272,610,830 | 246,939,554 | 25,935,223 | 23,735,692 | 32,415,912 | 34,170,091 | 1,595,758 | 1,219,225 | 624,117 | 20,557,217 | 333,181,840 | 326,621,779 |
| විකුණුම් පිරිවැය | (323,294,298) | (289,738,711) | (44,199,366) | (37,229,149) | (30,370,937) | (25,212,769) | (1,168,000) | (853,073) | (330,607) | (1,816,180) | (399,363,208) | (354,849,881) |
| කොටස් ප්‍රතිඵල | **(50,683,468)** | **(42,799,157)** | **(18,264,143)** | **(13,493,457)** | **2,044,975** | **8,957,322** | **427,758** | **366,152** | **293,510** | **18,741,037** | **(66,181,368)** | **(28,228,102)** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | | | | | | | | | | | 82,305,722 | 105,672,469 |
| පරිපාලන හා සාමාන්‍ය වියදම් | | | | | | | | | | | (45,030,083) | (37,594,503) |
| මෙහෙයුම් කටයුතු වලින් ලාභය/(අලාභය) | | | | | | | | | | | (28,905,729) | 39,849,864 |
| අනෙකුත් වියදම් | | | | | | | | | | | (3,467,719) | 217,103 |
| ශුද්ධ මූල්‍ය ආදායම (පිරිවැය) | | | | | | | | | | | (1,248,811) | (2,544,451) |
| ආදායම් බදු වියදම් | | | | | | | | | | | (681,564) | - |
| රාජ්‍ය දීමනා - පුනරාවර්තන | | | | | | | | | | | 95,000,000 | 173,300,000 |
| වර්ෂය සඳහා ලාභය/අලාභය | | | | | | | | | | | 60,696,177 | 210,388,310 |

**සටහන 18 - අනෙකුත් මෙහෙයුම් ආදායම්**

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම වෙනස් කිරීමෙන් ලාභය | 4,163,665 | 51,235,672 |
| ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය | 916,978 | 916,978 |
| වැලි ආදායම | 5,938,067 | 7,182,374 |
| ඇල්කඩුව වැවේ ආදායම | 66,648,890 | 42,161,694 |
| කල්බදු කුලිය | 4,456,699 | 3,848,825 |
| ප්‍රදාන සහ සහනාදාර | 181,423 | 326,953 |
| | **82,305,722** | **105,672,496** |

**සටහන 19 - පරිපාලන වියදම්**

බදු පෙර ආදායම පහත දෑ අයකර ගැනීමෙන් අනතුරුව සඳහන් කර ඇත

| | | |
|---|---|---|
| ගණකාධිකරන වේතන | 630,006 | 365,000 |
| ක්ෂයවීම්/ ක්‍රමක්ෂය | 7,476,451 | 10,911,877 |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 393,787 | 420,000 |
| අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් පිරිවැය - අර්ථසාධක දීමනා හා | 16,094,793 | 1,040,391 |
| අනෙකුත් - කාර්ය මණ්ඩල පිරිවැය | 100,000 | 12,225,819 |

**සටහන් 20 - වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| EPF/ETF/ESPS/CPPS හා පරිතෝශික නොගෙවීම් අධිභාර | 1,508,790 | 217,103 |
| ප්‍රදාන | 84,250 | - |
| හරිත භූමි වැඩසටහන් වියදම් | 1,874,679 | - |
| | 3,467,719 | 217,103 |

**සටහන 21 - මූල්‍ය ආදායම**

| | | |
|---|---|---|
| පොලී අදායම | 8,020,310 | 4,410,836 |
| | **8,020,310** | **4,410,836** |

**සටහන 22 - මූල්‍ය වියදම්**

| | | |
|---|---|---|
| අයිරා පොලිය | 7,669,121 | 5,355,287 |
| තාවකාලික ණය පොලිය | 1,600,000 | 1.600,000 |
| | **9,269,121** | **6,955,287** |

## සටහන 23 - ආදායම් බදු වියදම්

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා ඉන් පසුව සිදු කරන ලද සංශෝධන අනුව, වගාවෙන් "නිශ්චිත ලාභ" 12% ක සහන අනුපාතයකින් ආදායම් බද්දට යටත් වේ. නිෂ්පාදනයට අදාළ ආයතනික බදු අනුපාතය 28% ක අනුපාතයක් වනු ඇත.
කෙසේ වෙතත්, සමාගමේ සමුච්චිත හා වත්මන් බදු අලාභ සැලකිල්ලට ගනිමින් ආදායම් බදු සඳහා මෙම මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොමැත. 2018 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ ඉදිරියට ගෙන යන බදු

අලාභය රු. 185,267,818/- ක් වේ. බදු අලාභය කාලයට වඩා ඉදිරියට ගෙන යන බැවින් ගිණුම්වල විලම්බිත බදුකරණය සඳහා විධිවිධාන සලසා නොමැත.

| 23.1 අදායම් බදු (වියදම්)/ ප්‍රතිපූර්ණය | 2018 | 2017 |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ අදායම් බදු ( සටහන් 23.2) | 681,564 | - |
| විලම්බිත බදු(23.4) | - | - |
| ඌන/(අධි) වෙන් කිරීම් | - | - |
| | **681,564** | **-** |

**23.2 ගිණුම්කරණ ලාභය බදු ලාභය දක්වා ගැලපීම**

| | | |
|---|---|---|
| ගිණුම්කරණ ලාභය(බදු පෙර) | (33,622,258) | 37,088,435 |
| ඉඩනොදෙනු ලබන වියදම් ගැලපීම | 31,681,129 | (94,753,004) |
| ඉඩදෙනු ලබන වියදම් ගැලපීම | (4,010,206) | 3,398,471) |
| වෙනත් අදායම් ප්‍රභවයන්/පොළී අදායම් | (4,868,312) | - |
| බදු අලාභය ගැලපීම (සටහන් A) | (185,267,818) | - |
| | (196,087,466) | (54,266,098) |
| 14% අනුප්‍රමාණය මත පොළී අදායම සඳහා බදු | 681,564 | - |
| වත්මන් වසරේ ලාභය මත ආදායම් බද්ධ | **681,564** | |

**සටහන A - බදු අලාභය ගැලපීම**

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ අලාභ | 174,448,170 | 193,441,304 |
| ගැලපීම් | | |
| එ.වාා අදායමෙන් 35% ප්‍රමාණය | - | (18,993,134) |
| ඉදිරියට ගෙන ආ බදු අලාභ | 10,819,648 | - |
| | 185,267,818 | 174,448,170 |

**සටහන 23.3 විලම්බිත බදු වත්කම්/ (වගකීම්)**

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය | - | - |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම-විලම්බිත බදු වත්කම් | - | - |
| වසර අවසාන ශේෂය | | - |

| | | |
|---|---|---|
| දේපල ,පිරියත හා උපකරණ | - | - |
| සේවක විශ්‍රාම ප්‍රතිලාභ | - | - |
| පොළී අදායම් | - | - |
| ජීව විද්‍යාත්මක වත්කම් | - | - |
| මුළු වත්කම් | - | - |
| | - | - |

**සටහන 24 - රජයේ ප්‍රදාන - පුනරාවර්තන**

| | | |
|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 95,000,000 | 173,300,000 |
| | 95,000,000 | 173,300.000 |

**සටහන 24 - කොටසක ඉපයුම**

වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය මෙම කාල සීමාව තුළ ගෙවිය යුතු සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ විට ලැබෙන අගය මත පදනම්ව කොටසක මූලික ඉපැයීම් ගණනය කර ඇත.

| | **2018** | **2017** |
|---|---|---|
| සාමාන්‍ය පාර්ශවකරුවන්ට අදාළ වන අලාභය - රු. | 60,696,178 | 210,388,435 |
| නිකුත් කර ඇති සාමානය කොටස් වල බර තැබූ සාමාන්‍ය | 18,000,001 | 18,000,001 |
| **කොටසක ආදායම - මූලික හා තනුක** | **3.37** | **11.69** |

**සටහන 25 – ප්‍රාග්ධන බැදියාව**

ශේෂ පත්‍රයේ දිනය වන විට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් නොමැත.

**සටහන 26 - අවිනිශ්චිත වගකීම්**

**කම්කරු කොමසාරිස්**

හිඟ EPF/ETF ප්‍රතිපාදන පියවා ගැනීමට කම්කරු කොමසාරිස් විසින් නඩු රාශියක් ගොනු කරන ලදී. තවද සේවකයින්ට විශ්‍රාමික පාරිතෝෂික දීමනා පියවා නොතිබීම හේතුවෙන්ද සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඉහත සඳහන් දේට අමතරව ශේෂ පත්‍ර දිනට හිඟ ද්‍රව්‍යමය අවිනිශ්චිත වගකීම් නොමැත.

**සටහන 27 - ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන දේ**

වසර තුල අනාවරණය කල හැකි ගනුදෙනු නොමැත.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | PLA/A/EPL/01/18/18 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2019 සැප්තැම්බර් [illegible] දින | |

සභාපති

ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්

**ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

------------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරනණ ප්‍රමිත16 අනුව වත්කම් භාවිතය සඳහා සූදානම් අවස්ථාවේ සිට ක්ෂය කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද පිරිවැය රු.2,736,018ක් වූ වත්කම් ඒ අනුව ක්ෂය නොකිරීම හේතුවෙන් සමාලොචිත වර්ෂයේ ක්ෂය වියදම 543,147 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. එසේම ප්‍රමිතයේ 51 වන ඡේදය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් හා දැනට

භාවිතා කරනු ලබන පිරිවැය රු.22,109,920 ක් වූ වාහන නැවත අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරනණ ප්‍රමිත 41 හි 13 ඡේදය අනුව, කෘෂිකාර්මික නිෂ්පාදන විකුණුම් සඳහා වියදම් අඩුකල පසු සාධාරණ වටිනාකමට අගය කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පොල් ගෙඩි 165,023 ක් සහ එකතුව කිලෝ ග්‍රෑම් 4010 ක් වූ කොකෝවා, කරාබු, කෝපි, කොප්පරා හා ඔට්ටපාළු යන කෘෂිකර්ම නිෂ්පාදන සාධාරණ වටිනාකමට අගයකර අවසන් තොග ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) තේ කර්මාන්තයේ යෙදී සිටින සමගාමී ආයතන විසින් තේ ගසක පරිනත වීමේ කාලය වර්ෂ 04 ක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන මගින් ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණද, සමාගම විසින් ඒ සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම හේතුවෙන්, 1998 වර්ෂයේ සිට 2014 වර්ෂය අතර කාලයේදී පිරිවැය රු.64,569,065 ක් දරා ආරම්භ කරන ලද තේ නැවත වගාවන් හා පාලු සිටුවීම් මේ දක්වා පරිනත වගාවන් ලෙස හඳුනාගෙන ගිණුම් මගින් සටහන්කර නොතිබුණි.

(ඈ) සමාගම විසින් පරිනත නොවූ වගාවන් පරිනත වීමට ගතවන කාලය පිළිබඳව ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම හේතුවෙන්, 1993 වර්ෂයේ සමාගම ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් පවරා දී තිබූ රු.87,740,383 ක පරිනත නොවූ වගාවන් වල කාලය සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 25 ක් ඉක්ම වී තිබුණද, තවදුරටත් පරිනත නොවූ වත්කම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශන මගින් දක්වා තිබුණි.

(ඉ) සෙම්බුවත්ත වැවේ සංචාරක ව්‍යාපෘති මගින් ලද රු.59,307,500 ක මුදලින් ගෙවා තිබූ රු.14,826,875 ක මුදල සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සෙලගම වතුඅධිකාරි බංගලාව අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දරා තිබූ රු.549,913 ක පිරිවැය වෙළෙඳ ණයගැතියන් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම ශේෂය වැඩියෙන් සටහන් වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.418,246,033 ක් වූ ධාරක ජීව වත්කම්හි ඇතුලත් රු.57,475,642 ක් වූ දැව වගා වටිනාකම එම වත්කම් වලින් ඉවත්කර පාරිභෝජ්‍ය ජීව වත්කම් ලෙස සටහන්කර නොතිබීම හේතුවෙන් ධාරක ජීව වත්කම් වටිනාකම වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඌ) වතු ගිණුම් අනුව, 2017 වර්ෂයේදී පරිනත වූ රු.70,373,791 ක රබර් හා පොල් වගා පිරිවැය එම වර්ෂයේ පරිනත වූ වගාවක් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් සටහන්කර ක්‍රමක්ෂය ගැලපීම් නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයට අදාල රු.2,185,509 ක එම වියදම් අඩුවෙන් සටහන් වී තිබුණි.

(එ) තේ පැල සිටුවීමට වර්ෂ 02 කට පෙර බිම සැකසීම සඳහා 2007 හා 2010 අතර කාලයේදී දරා තිබූ රු.4,222,549 ක වියදම පරිනත නොවූ වගාවන් යටතේ ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත

වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිනත නොවූ තේ වගා පිරිවැය එම අගයෙන් වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඒ) 2007 වර්ෂය දක්වා නාලන්ද වතුයාය මගින් පරිනත නොවූ වගාවන් ලෙස ගිණුම්ගත කර තිබූ පිරිවැය රු.337693ක් වුවත්, එම වර්ෂය දක්වා පරිනත වගාවෙන් ඉවත්කරන ලද පිරිවැය රු.7,251,361ක් වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවතිය යුතු පරිනත නොවූ වගා පිරිවැය රු.6,913,668 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ විස්තිරණ ආදායම් ප්‍රකාශනය අනුව ක්ෂය හා පාරිතෝෂික වියදම පිළිවෙලින් රු.8,109,189 ක් හා රු.38,980,421ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වියදම් රු.6,813,113 ක් හා රු.31,148,508 ක් ලෙස ගැලපීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වල මුදල් ප්‍රවාහය රු.9,127,989 ක් වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඕ) සමාගමේ වතු හා ප්‍රධාන කාර්යයාලය අතර සිදුවන ගණුදෙනු සටහන් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය හා එකිනෙක වතු මගින් පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් ශේෂ හිලව් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම්වල රු.299,934,257ක හර ශේෂයක් හා වතු පාලන ගිණුම් අනුව රු.327,247,677ක හර ශේෂයක් පැවතීම හේතුවෙන් එම ගිණුම් අතර රු.27,313,240ක වෙනසක් පැවතුනි.

(ක) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භෞතිකව නොමැති වටිනාකම රු.1,617,520ක් වූ පැල තවාන්, දර හා අනෙකුත් ද්‍රව්‍ය අවසන් තොග වටිනාකමට ඇතුලත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා තොග වටිනාකම අධිගණනය වී තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවතිය යුත විලම්භිත බදු වගකීම රු. 37,356,930 ක් වුවත් සමාගම විසින් එය රු. 21,008,134 ක විලම්භිත වත්කමක් ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.58,365,064 ක් වැඩියෙන් සටහන් වී තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කල මුල්‍ය තත්ව ප්‍රකාශණය අනුව සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු.1,185,670 ක් හා රු.1,768,749 ක් වුවත් අදාල ආයතන වල එම අගය පිළිවෙලින් රු.8,723,922 ක් හා රු.1,743,955 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් අදාල වටිනාකම් අතර පිළිවෙලින් රු.7,538,252 ක හා රු.24,794 ක වෙනසක් නිරූපනය විය.

(ට) භෝග විවිධාංගිකරණය (Crop Diversification) යටතේ ප්‍රාග්ධනිත කර තිබූ.18,432,380 ක පිරිවැයට අදාල වගාවන් වෙන වෙනම හඳුනා ගැනීමට අදාල වගා ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් රු.1,191,552 ක් වූ තැන්පතු වලට අදාල තැන්පත්කරුවන්ගේ ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ණ) පිරිවැය රු.96,151,524 ක් වූ දේපළ පිරියත හා උපකරණ වටිනාකම තහවුරු කර ගැනීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණය සමාගම විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි

(ත) වටිනාකම පිළිවෙලින් රු.88,583,376 ක් වූ ණයගැති ශේෂ 14 ක සහ රු.2,863,126 ක් වූ ණයහිමි ශේෂ 12 ක් තහවුරුකරගැනීමට අදාල ශේෂ සනාතන ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති

ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ)වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් නොතිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

  - සමාගමේ සභාපතිවරයාට හිමි මාතලේ ප්‍රදේශයේ පිහිටි නිවසක් 2017 වර්ෂයේ නොවැම්බර් මස සිට මාසික කුලී පදනම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයකු සඳහා ලබාගෙන තිබූ අතර, ඒ සඳහා බදුකුලී ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.305,000 ක් ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | ii වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්වීමක් කලයුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික පදනමකින් වුවද, සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා නිත්‍ය පදනමින් නිළධාරියකු පත් නොකර, වැඩ බැලීමට හා තාවකාලික පදනම මත නිළධාරීන් 03 දෙනෙකු 2011 වර්ෂයේ සිට පත්කර තිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 15 වන වගන්තිය | සේවා යෝජක විසින් තම සේවකයාගේ දායක මුදල සේවක ඉපයුම් වලින් අඩුකර ඊලග මාසයෙහි අවසන් දිනට පෙර අරමුදලට ප්‍රේෂණය කල යුතු වුවත්, 2004 සිට 2016 ජුනි දක්වා නොගෙවූ වගකීම රු.113,681,008ක් හා වතු සේවකයිනගේ අර්ථසාධක අරමුදලට රු.5,828,972 ක්ද, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට රු.8,370,625 ක් ගෙවීමට පැවතුණි. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II වන කොටසේ 16(I) වගන්තිය | සේවා යෝජක විසින් තම සේවකයාගේ මුළු ඉපයුම් වලින් සියයට 3 ක් අඩුකර ඊලග මාසයෙහි අවසන් දින හෝ ඊට පෙර අරමුදලට ප්‍රේෂණය කල යුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නොගෙවූ එම වගකීම රු.9,284,933 ක් ව පැවතුණි. |
| (ඈ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(I) වගන්තිය | යම් සේවකයකු සේවය අවසන් කිරීමේ දින සිට දින 30ක කාලයක් ඇතුළත ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නොගෙවූ එම වගකීම රු.116,127,708 ක් විය. |

(ඇ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i). චක්‍රලේඛය අනුව ඉන්ධන දීමනා හිමිකම් නොමැති MM වැටුප් බාණ්ඩයේ නිළධාරීන් 03 ක් හා තාවකාලික පදනම බඳවාගත් නිළධාරීන් 03 ක් සඳහා 1,549,355 ක මුදලක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. තවද රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් සභාපතිවරයා විසින් අතිරේකව ලබාගන්නා ඉන්ධන සඳහා රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවත්, එසේ නොමැතිව සමාගමේ සභාපතිවරයා විසින් මාසික ඉන්ධන සීමාව ඉක්මවා ලබාගත් අතිරේක ඉන්දන ලීටර් 6,616 ක් සඳහා රු.528,434 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඈ) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයකු නැවත සේවයේ යෙදවිය යුතුනම් ඒ සඳහා අදාල අමාත්‍යංශ ලේකම්වරයාගේ නිර්දේශය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකු පත් කර තිබූ අතර ඒ සඳහා රු.912,500 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සමාගමට අයත් රත්වත්ත වතුයායේ පිහිටි තිරිවාණා නිධිය වර්ෂ 05 කාලයක් සඳහා කැණීම් කිරීමට ගිවිසුමක් මගින් බාහාර පාර්ශවයකට ලබා දී තිබූ අතර අදාල තිරිවාණා නිධිය බර අනුව අගය කර මිල නියම කල යුතු වුවත් එසේ නොමැතිව ගල් කියුබ් ගණනින් ලබා දීම සඳහා ගිවිසුම්ගත වීම මගින් සාධාරණ මිලක් සමාගම ලබාගෙන නොතිබූ අතර, ගිවිසුම්ගත පරිදි බදු ඇතුළුව රු.13,650 බැගින් ගල් කියුබ් 01 ක් මිල දී ගැනීමට ගැණුම්කරු එකහව පැවතියදී සමාගමේ සාමාන්‍යාධිකාරී(ආවණ) විසින් රු.1,000 බැගින් කියුබ් 104.6 ක් අලෙවි කිරීමට අවසර ලබා දීම මගින් සමාගමට රු.1,323,190 ක පාඩුවක් සිදුකර තිබුණි.

(ආ) සමාගමට අයත් බණ්ඩාරපොළ තේ කර්මාන්තශාලාව 2006 වර්ෂයේ සිට වර්ෂ 30 ක කාලයක් සඳහා පුද්ගලික සමාගමකට බදු දී තිබූ අතර, අදාල බදුකරු විසින් බදු නොගෙවීම හේතුවෙන් සමාගම අදාල කර්මාන්තශාලාව පවරාගනු ලැබුවද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.27,028,579 ක හිඟ බදු මුදල අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාගම විසින් සිදුකල ගණුදෙනුවලට අදාලව වර්ෂ 03 ඉක්ම වූ රු.87,385,616 ක ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් ගිණුම් ශේෂ අයකරගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතුකර නොතිබුණි.

(ඈ) සමාගම ස්ථාපිත කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් කල්බදු පදනම මත ලද හෙක්ටයාර් 1.8 ක භූමියක පිහිටි ගොඩනැගිල්ලක් 1996 ජූලි 25 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් අනුව රු.1,756,912 ක වන්දි මුදලක් ලබා ගැනීමේ එකඟතාවය මත ආරක්ෂක අමාත්‍යාංශයට ලබාදී තිබුණද, අදාල වන්දි මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

(ඉ) සමාගම විසින් සිදුකල ගණුදෙනුවලට අදාලව වර්ෂ 03 ඉක්ම වූ රු.16,453,931 ගෙවිය යුතු වෙළඳ හා අනෙකුත් ගිණුම් ශේෂ පියවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම කටයුතුකර නොතිබුණි.

(ඊ) වර්ෂ 01 සිට 12 ක් දක්වා කාලයක සිට නිරවුල් නොකරන ලද රු.4,145,432 ක ආපසු ගෙවිය යුතු ලංසු තැන්පතු සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට නිරවුල්කිරීමට කටයුතුකර නොතිබුණි.

(උ) සමාගම සතු හෙක්ටයාර් 4.25 ක ඉඩමක් පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.4,700,000 ක වන්දි මුදලක් ලබා ගැනීමේ එකඟතාවය මත ලබා දී තිබුණද, අදාල වන්දි මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාගමේ මානව සම්පත් කළමණාකරු තනතුර සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබු නමුත්, එම සුසුසුකම් සපුරා නොමැති නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත මානව සම්පත් කළමණාකරු තනතුර සඳහා 2019 වර්ෂයේදී බඳවාගෙන තිබුණි

(එ) සමාගම සතු කර්මාන්තශාලා 06 න් කර්මාන්තශාලා 03 ක් අක්‍රිය තත්වයේ පැවති අතර අක්‍රිය කර්මාන්තශාලා තේ නිෂ්පාදන කටයුතු සඳහා දායක කරගැනීමට හෝ බදු දීමට කටයුතුකර නොතිබුණි.

(ඒ) වියදම් ඇස්තමේන්තුවක් නොමැතිව ආරම්භකර තිබූ සෙලගම වතු බංගලාවේ අළුත්වැඩියා කටයුතු සඳහා රු.549,913 ක මුදලක් 2018 ජනවාරි සිට 2019 මැයි 30 දින දක්වා වැය කර තිබුණද, අදාල අළුත්වැඩියා කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා සඳහා බදුකුලී, කුලී නිවසේ මුරකරුගේ වැටුප හා විදුලි වියදම් සඳහා අදාල කාලය තුල රු.954,591 ක පිරිවැයක් සමාගම විසින් දර තිබුණි.

(ඔ) කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු සඳහා ස්ථිර පදනම මත නිලධාරීන් තිදෙනෙකුද, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 07 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,841,971 ක මුදලක් අනුමත නොවන වැටුප් හා වියදම් සඳහා ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

<u>**දස අවුරුදු සාරාංශය**</u>

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තේ (දළු) | | | | | | | | | | |
| **නිෂ්පාදනය (කි.)** | 3,177,777 | 3,363,647 | 3,203,887 | 2,527,183 | 3,054,375 | 3,254,254 | 4,007,397 | 2,541,465 | 2,711,081 | 3,144,670 |
| **NSA (කි. 1 කට)** | 47.27 | 50.32 | 48.37 | 53.23 | 58.58 | 62.37 | 56.64 | 64.58 | 91.09 | 86.69 |
| **COP (කි. 1 කට)** | 68.77 | 59.03 | 73.22 | 80.34 | 85.72 | 89.41 | 68.32 | 87.10 | 106.87 | 102.81 |
| රබර් (කිරි) | | | | | | | | | | |
| **නිෂ්පාදනය (කි.)** | 106,983 | 122,678 | 128,039 | 115,845 | 116,577 | 93,867 | 82,085 | 75,949 | 77,348 | 98,988 |
| **NSA (කි. 1 කට)** | 217.68 | 383.15 | 497.67 | 404.01 | 355.17 | 249.69 | 239.74 | 211.74 | 306.87 | 262.00 |
| **COP (කි. 1 කට)** | 273.21 | 240.46 | 293.77 | 335.79 | 373.54 | 414.12 | 335.15 | 369.60 | 481.32 | 446.51 |
| පොල් | | | | | | | | | | |
| **නිෂ්පාදනය (කි.)** | 1,492,051 | 1,039,314 | 1,405,748 | 1,219,915 | 519,293 | 1,368,257 | 969,648 | 1,354,715 | 841,674 | 919,804 |
| **NSA (කි. 1 කට)** | 16.15 | 18.77 | 25.12 | 21.50 | 18.11 | 29.09 | 27.93 | 20.79 | 42.10 | 35.24 |
| **COP (කි. 1 කට)** | 12.08 | 17.16 | 15.97 | 16.68 | 37.10 | 10.31 | 9.53 | 14.10 | 31.06 | 33.02 |
| ආදායම් ඉස්මතු කිරීම් | | | | | | | | | | |
| ආදයමම | | | | | | | | | | |
| **තේ** | 150,197,693 | 169,246,807 | 154,962,288 | 134,509,740 | 178,917,425 | 202,967,716 | 226,973,653 | 164,138,174 | 246,939,554 | 272,610,830 |
| **රබර්** | 23,288,262 | 47,003,772 | 63,721,290 | 46,802,602 | 41,404,680 | 23,437,577 | 19,678,894 | 16,051,285 | 23,735,692 | 25,935,223 |
| **පොල්** | 24,101,567 | 19,505,766 | 35,318,147 | 26,233,746 | 9,405,529 | 39,805,702 | 27,078,934 | 28,160,182 | 34,170,091 | 32,415,912 |
| **කොකෝවා** | 5,098,915 | 5,766,131 | 2,870,475 | 6,994,626 | 866,755 | 3,104,207 | 2,205,908 | 1,319,324 | 1,219,225 | 1,595,758 |
| **අනෙකුත්** | 4,079,513 | 10,555,187 | 6,571,223 | 24,411,101 | 15,738,218 | 16,267,934 | 3,392,207 | 1,726,780 | 20,557,217 | 624,117 |
| | 206,765,950 | 252,077,663 | 263,443,423 | 238,951,815 | 246,332,607 | 285,583,136 | 279,329,596 | 211,395,745 | 326,621,779 | 333,181,840 |
| විකුණුම් පිරිවැය | | | | | | | | | | |
| **තේ** | (218,539,933) | (198,567,516) | (234,593,600) | (203,022,387) | (261,830,106) | (290,968,312) | (273,766,102) | (221,379,222) | (289,738,711) | (323,294,298) |
| **රබර්** | (29,229,061) | (29,498,603) | (37,613,552) | (38,899,976) | (43,546,143) | (38,871,838) | (27,510,507) | (28,071,120) | (37,229,148) | (44,199,366) |
| **පොල්** | (18,023,908) | (17,834,995) | (22,447,307) | (20,354,098) | (19,266,567) | (14,104,993) | (9,242,178) | (19,101,095) | (25,212,769) | (30,370,937) |
| **කොකෝවා** | (2,902,490) | (2,148,596) | (958,749) | (1,862,725) | (2,243,897) | (1,659,943) | (969,355) | (846,694) | (853,073) | (1,168,000) |
| **අනෙකුත්** | (1,375,019) | (2,249,620) | (2,507,337) | (563,035) | (410,354) | (196,289) | (498,044) | (352,626) | (1,816,180) | (330,607) |
| | (270,070,411) | (250,299,330) | (298,120,545) | (264,702,221) | (327,297,067) | (345,801,375) | (311,986,186) | (269,750,757) | (354,849,881) | (399,363,208) |
| **මුළු ලාභය** | (63,304,461) | 1,778,333 | (34,677,122) | (25,750,406) | (80,964,460) | (60,218,239) | (32,656,590) | (58,355,012) | (28,228,102) | (66,181,368) |
| **අනෙකුත් මෙහෙයුම් ලාභ** | 33,838,253 | 24,017,293 | 44,107,888 | 18,778,229 | 39,252,255 | 118,336,330 | 38,690,826 | 38,753,932 | 105,672,469 | 82,305,722 |
| **භාණ්ඩාගාර ප්‍රදාන** | | - | - | - | - | - | - | | | |
| **පරිපාලන හා සාමාන්‍ය වියදම්** | (25,289,194) | (23,801,245) | (25,940,298) | (19,443,269) | (18,283,239) | (20,705,368) | (26,215,237) | (26,481,901) | (37,594,503) | (45,030,083) |
| මෙහෙයුම් කටයුතු වලින් ලාභය | (54,755,402) | 1,994,381 | (16,509,532) | (26,415,446) | (59,995,444) | 37,412,723 | (20,181,001) | (46,082,981) | 39,849,864 | (28,905,729) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (7,269,049) | | | | | | | (10,329,290) | - | (3,467,719) |
| **ශුද්ධ මූල්‍ය ලාභය/ (අලාභය)** | (7,269,049) | (6,401,381) | (13,224,266) | (8,194,191) | (4,953,644) | (7,010,560) | (6,741,927) | (6,343,908) | (2,761,554) | (1,248,811) |
| | | | | | | | | | | |
| බදු රහිත ලාභය | (62,024,451) | (4,407,000) | (29,733,798) | (34,609,637) | (64,949,088) | 30,402,163 | (26,922,928) | (62,756,179) | 37,088,310 | (33,622,259) |
| **ආදායම් බදු** | (664,174) | (558,701) | - | (558,701) | - | - | - | - | - | (681,564) |
| වර්ෂය සඳහා ලාභය | (62,688,625) | (4,965,701) | (29,733,798) | (35,168,338) | (64,949,088) | 30,402,163 | (26,922,928) | (62,756,179) | 37,088,310 | (34,303,823) |
| **භාණ්ඩාගාර ප්‍රධාන** | | | | | | | 175,000,000 | 75,831,000 | 173,300,000 | 95,000,000 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | | | | | | | | |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | (62,688,625) | (4,965,701) | (29,733,798) | (35,168,338) | (64,949,088) | 30,402,163 | 148,077,072 | 13,074,821 | 210,388,310 | 60,696,177 |

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| ශේෂ පත්‍ර විස්තර | | | | | | | | | | |
| වත්කම් | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 427,398,109 | 451,877,451 | 482,032,236 | 647,381,241 | 665,800,410 | 865,717,941 | 897,597,079 | 914,582,712 | 963,897,270 | 1,000,521,909 |
| ජංගම වත්කම් | 33,666,472 | 33,477,134 | 78,364,891 | 39,550,126 | 40,707,446 | 75,780,080 | 102,043,243 | 119,179,940 | 167,290,123 | 203,463,125 |
| මුළු වත්කම් | 461,064,581 | 485,354,585 | 560,397,127 | 686,931,367 | 706,507,856 | 941,498,021 | 999,640,322 | 1,033,762,652 | 1,131,187,393 | 1,203,985,034 |
| | | | | | | | | | | |
| කොටස් හා වගකීම් | | | | | | | | | | |
| ප්‍රාග්ධන හා සංචිත | | | | | | | | | | |
| සඳහන් ප්‍රාග්ධන | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 | 180,000,010 |
| පවතින ලැබීම් | (179,869,276) | (148,597,533) | (204,599,279) | (127,008,503) | (188,766,728) | (4,662,882) | 149,369,122 | 90,068,526 | 298,648,472 | 366,996,649 |
| පාර්ශව කරුවන්ගේ අරමුදල | 130,734 | 31,402,477 | (24,599,269) | 52,991,507 | (8,766,718) | 175,337,128 | 329,369,132 | 270,068,536 | 478,648,482 | 546,996,659 |
| වගකීම් | | | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | 223,800,099 | 225,596,659 | 253,531,341 | 204,459,762 | 219,452,526 | 244,907,880 | 200,850,985 | 178,317,245 | 186,351,256 | 205,203,683 |
| ජංගම වගකීම් | 237,133,748 | 228,355,448 | 331,465,055 | 429,480,096 | 495,822,048 | 521,253,013 | 469,420,205 | 585,376,871 | 466,187,655 | 451,784,693 |
| මුළු ප්‍රාග්ධන හා සංචිත | 461,064,581 | 485,354,584 | 560,397,127 | 686,931,365 | 706,507,856 | 941,498,021 | 999,640,322 | 1,033,762,652 | 1,131,187,393 | 1,203,985,035 |
| | | | | | | | | | | |
| මූල්‍ය ප්‍රවාහ විස්තර | | | | | | | | | | |
| වසර මුල මුදල් හා මුදල් වලට සමාන දෑ | (1,452,558) | (5,695,546) | (10,688,092) | (51,265,048) | (45,139,536) | (49,803,932) | (61,745,546) | (60,277,701) | (34,003,533) | 9,705,092 |
| මෙහෙයුම් කටයුතු වලින් ලද/ (වියදම් කල) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | 50,084,315 | 24,979,109 | 21,177,343 | 138,916,481 | (20,956,744) | 49,387,001 | (127,850,178) | (24,806,560) | (106,167,478) | (82,454,317) |
| ආයෝජන කටයුතු වලින් ලද/ (වියදම් කල) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | (60,130,828) | (33,884,008) | (79,972,339) | (130,758,119) | 25,050,411 | (48,910,016) | (44,112,676) | (24,750,272) | (23,423,897) | (35,312,483) |
| මූල්‍ය කටයුතු වලින් ලද/ (වියදම් කල) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | 5,803,525 | 3,912,353 | 18,218,040 | (2,032,850) | (8,758,063) | (12,418,599) | 173,430,699 | 75,831,000 | 173,300,000 | 96,686,613 |
| වසර අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ | (5,695,546) | (10,688,092) | (51,265,048) | (45,139,536) | (49,803,932) | (61,745,546) | (60,277,701) | (34,003,533) | 9,705,092 | (11,375,095) |
| | | | | | | | | | | |
| අනුපාත විශ්ලේෂණය | | | | | | | | | | |
| මුළු ලාභ සීමාව | -31% | 1% | -13% | -11% | -33% | -21% | -12% | -28% | -9% | -20% |
| ශුද්ධ ලාභ සීමාව | -30% | -2% | -11% | -15% | -26% | 11% | -10% | -30% | 11% | -10% |
| ජංගම වත්කම් අනුපාතය | 0.14 | 0.15 | 0.24 | 0.09 | 0.08 | 0.15 | 0.22 | 0.20 | 0.36 | 0.45 |
| කොටසක ආදායම | (3.48) | (0.28) | (1.65) | (1.95) | (3.61) | 1.69 | 8.23 | 0.73 | 11.69 | 3.37 |
| කොටසකට ශුද්ධ වත්කම් | 0.01 | 1.74 | (1.37) | 2.94 | (0.49) | 9.74 | 18.30 | 15.00 | 26.59 | 30.39 |


## වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය

ඇල්කඩුව වතු සීමාසහිත සමාගමේ 2018 වර්ෂය සඳහා වාර්ෂික මහා සභා රැස්වීම මෙලෙස නිවේදනය කරන අතර එය ඇල්කඩුව වතු සීමාසහිත සමාගම, අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ස්ථානයේ ............................... දින ප.ව. 4.00 ට පහත කරුණු සඳහා පැවැත්වේ.

1. අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව හා විගණන වාර්තාව සමඟ 2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීම හා සලකා බැලීම.
2. 2018 වර්ෂයේ සමාගමේ විගනකවරුන් ලෙස ජාතික විගණන කාර්යාලය පත් කිරීම.
3. අනෙකුත් ව්‍යාපාර කටයුතු.

**ඇල්කඩුව වැවිලි සමාගමේ**

**අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි**



**ඇල්කඩුව වැවිලි සමාගමේ ලේකම්**

දිනය:.......................................................

පාර්ශවකරුවන්ට රැස්වීමට සහභාගී වීමේ හා ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පවතින අතර ඔහු/ඇය  වෙනුවෙන් වෙනත් නියෝජිතයෙකු පත් කිරීමේ අයිතියද පවතියි.

නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකු විය යුතු නොවේ. මේ සඳහා නියෝජිත ආකෘති පත්‍රය අමුණා ඇත.

## නියෝජිත ආකෘති පත්‍රය

ඇල්කඩුව වැවිලි සමාගමේ සාමාජිකයෙකු/ සාමාජිකයින් වන පහත අත්සන් තබා ඇති ......................................වන මම/ අපි මෙලෙස නිර්දේශ කරමු.

නාලක දේවින්ද මඩවල මහතා හෝ ඔහුගේ අසමත් වීම
රාමනායකගේ මාලික ජයන්ති මහත්මිය හෝ ඇයගේ අසමත්වීම
වික්‍රමසිංහ මුදියන්සේලාගේ ධම්මික තරංගනී වික්‍රමසිංහ මහත්මිය හෝ ඇයගේ අසමත්වීම
වන්නකුවත්ත වඩුගේ රුවිර නිශාන්ත ප්‍රනාන්දු මහතා හෝ ඔහුගේ අසමත් වීම
සේන ගංගොඩතැන්න මහතා හෝ ඔහුගේ අසමත් වීම
නිලූෂා මනෝරි තන්ත්‍රිගේ මහත්මිය හෝ ඇයගේ අසමත්වීම
රන්ජිත් අසෝක හේරත් මහතා හෝ ඔහුගේ අසමත් වීම

හෝ,

ඇල්කඩුව වතු සමාගම, කොළඹ කාර්යාලය, අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ස්ථානයේ ..................... දින ප.ව. 4.00 ට පැවැත්වීමට නියමිත 2018 වර්ෂය සඳහා වාර්ෂික මහා සභා රැස්වීමේදී, එහි ඕනෑම කල් තැබීමකදී හා එහි ප්‍රතිඵලයක් ලෙස ගත හැකි සෑම ඡන්ද විමසීමකදීම මා/ අප වෙනුවෙන් මා/අප ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හා මා/අප නියෝජනය කිරීමට..........................................................................................................

විභේදන අංකය ඉදිරිපිට "x" ලකුණ යෙදීම මගින් ඔබගේ පැමිණීම තහවුරු කරන්න.

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව හා විගණන වාර්තාව සමඟ 2018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ලබා ගැනීම හා සලකා බැලීම. | ☐ | ☐ |
| 2018 වර්ෂයේ සමාගමේ විගනකවරුන් ලෙස ජාතික විගණන කාර්යාලය පත් කිරීම | ☐ | ☐ |

මෙය 2019 ................... මස ......................දින අත්සන් තබන ලදී.

...........................................
අත්සන
පාර්ශවකරුවන්ගේ ජා.හැ.අ., ගුවන් ගමන් බලපත්‍ර අංකය/ සමාගමේ ලියාපදිංචි අංකය

**නියෝජිත ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

1. දී ඇති ඉඩෙහි අත්සන් තබා හා අත්සන් තබන දිනය සම්පූර්ණ කර නියෝජිත ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න
2. නියෝජිත ආකෘති පත්‍රය නීතිඥවරයෙකු විසින් අත්සන් කර ඇත්නම්, සමාගම විසින් දැනටමත් ලියාපදිංචි කර නොමැති නම්, සම්පූර්ණ කරන ලද නියෝජිත ආකෘති පත්‍රය සමඟ නීතිඥවරයාගේ සාපේක්ෂ බලයද ලැබෙනු ඇත.

සම්පූර්ණ කරන ලද නියෝජිත ආකෘති පත්‍රය රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර ලබා දිය යුතුය.

## ආයතනික තොරතුරු

ආයතනයේ නම : ඇල්කඩුව වැවිලි සමාගම

නීතිමය ආකෘතිය : සම්පූර්ණයෙන් රජය යටතේ පවතින සීමාසහිත වගකීම් සමාගමකි. ඇල්කඩුව වතු සීමාසහිත සමාගම අංක 17 දරණ සමාගම් පනතේ සංස්ථා හා රාජ්‍ය ව්‍යාපාර පොදු සමාගම් පත් කිරීමේ 1987 අංක 23 දරණ පනත යටතට පත් කර 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී.

සංස්ථාපිත දිනය : 1993 ජූලි 23

සමාගම් ලියාපදිංචි අංකය: PB 5

ලියාපදිංචි කාර්යාලය : අංක. 320, "ජනවතු පියස", ටී.බී. ජයා මාවත, කොළඹ 10

මූලික ව්‍යාපාර කටයුතු : සමාගමේ මූලික කටයුත්ත වන්නේ තේ, රබර්, පොල් හා අනෙකුත් සුළු භෝග වගා කිරීම හා නිෂ්පාදනය

**<u>2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය</u>**

| | |
|---|---|
| නාලක දේවින්ද මඩවල මහතා | - සභාපති/ අධ්‍යක්ෂ |
| රාමනායකගේ මාලිකා ජයන්ති මිය | - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත |
| වික්‍රමසිංහ මුදියන්සේලාගේ ධම්මිකා තරංගනී වික්‍රමසිංහ මිය | - අධ්‍යක්ෂ/ අමාත්‍යාංශ නියෝජිත |
| වන්නකුවත්ත වඩුගේ රුචිර නිශාන්ත ප්‍රනාන්දු | - අධ්‍යක්ෂ |
| නිශාන්ත ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| සේන ගංගොඩතැන්න මහතා | - අධ්‍යක්ෂ |
| නිලූෂා මනෝරි තන්ත්‍රිගේ මිය | - අධ්‍යක්ෂ |
| රන්ජිත් අසෝක හේරත් මහතා | - අධ්‍යක්ෂ |

2019 පෙබරවාරි 03 දින මුදල් අමාත්‍යාංශය මඟින් පත්කරන ලද වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ.


| | |
|---|---|
| කඹුරු දෙනියගේ සුමිත් ජයරත්න මහතා | - සභාපති/ අධ්‍යක්ෂ |
| රණසිංහ ආරච්චිලාගේ සුසන්ත කුමාර රණසිංහ මහතා | - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත |
| අමිතා උදයකුමරි දොඩන්වල මහත්මිය | - අධ්‍යක්ෂ/ අමාත්‍යාංශ නියෝජිත |
| උඩහ මුරුතැන් රාලලාගේ සමරවීර මහතා | - අධ්‍යක්ෂ |
| සුගත් හේවාපතිරණ මහතා | - අධ්‍යක්ෂ |
| ලලිත් කුමාර ආටිගල මහතා | - අධ්‍යක්ෂ |

කොටස් ප්‍රාග්ධනය: මෙම කාල පරිච්ඡේදය තුල අවසරලත් හා නිකුත් කල කොටස් ප්‍රාග්ධන වෙනසක් නොමැත.

| | | |
|---|---|---|
| අවසරලත් කොටස් ප්‍රාග්ධන | කොටසක මිල රු. 10 ලෙස කොටස් 50,000,000 | රු. 500,000,000 |
| නිකුත් කල කොටස් ප්‍රාග්ධන | කොටසක මිල රු. 10 ලෙස කොටස් 18,000,000 | රු. 180,000,000 |
| රන්කොටස් 1 | රු. 10 | රු. 10 |

| | |
|---|---|
| සමාගම් ලේකම්: | චන්ද්‍රානි සූරියආරච්චි මහත්මිය<br>නීතීඥ - මහජන නොතාරිස් සහ සමාගම් ලේකම් |
| විගනකවරුන්: | ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව (ජාතික විගණන කාර්යාලය) |
| බැංකු: | ලංකා බැංකුව - ආයතනික ශාඛාව<br>මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව |
| ඇමතුම් විස්තර: | දුරකථන 011 – 2698058/59<br>ෆැක්ස් 011 – 2698057<br>ඊමේල් elkaduwacmbepl@sltnet.lk |

**අධ්‍යක්ෂ මණ්ඩල විධානයට අනුව**



චන්ද්‍රානි සූරියආරච්චි මහත්මිය
නීතීඥ - මහජන නොතාරිස් සහ සමාගම් ලේකම්
ඇල්කඩුව වතු සීමාසහිත සමාගම
"ජනවතු පියස"
අංක 320, ටී.බී ජයා මාවත
කොළඹ 10